# සිත
# මිස කය නැති බඹලොව
# කය
# මිස සිත නැති බඹලොව

- කර්මය
- පින සහ කුසලය
- අපාය තියෙන්නේ කොහේද?
- දිව්‍ය ලෝකය

සම්පාදක
ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ
ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාධිපති හා ප්‍රධාන අනුශාසක
ත්‍රිපිටකාචාර්ය මහා කම්මට්ඨානාචාර්ය
ශ්‍රී ජිනවංශ ඤාණාරාම වංශාගතංශ, සද්ධර්මවාගීස්වරාචාර්ය
අතිගරු පූජනීය නා උයනෙ අරියධම්මාභිධාන
අනුනායක මාහිමිපාණන් වහන්සේ.

උතුම් ධර්මදානයක් ලෙස පිළිගන්වන්නේ බැතියෙනි.

"සබ්බ දානං ධම්ම දානං ජිනාති"

(සියලු දානයන් පරදවා ධර්ම දානය ජය ගනී.)

**සිතෙහි නැඟෙන ගැටළුවට**

**අති පූජ්‍ය නා උයනේ අරියධම්ම**

**මහා ස්වාමින් වහන්සේගෙන් පිළිතුරු**

# **සිත**
# මිස කය නැති බඹලොව
# **කය**
# මිස සිත නැති බඹලොව


- කර්මය
- පින සහ කුසලය
- අපාය තියෙන්නේ කොහේද?
- දිව්‍ය ලෝකය

© Lithira ලිතිර Printing Industries 2016 4 16

306, ඇඹුල්දෙණිය හංදිය, නුගේගොඩ.
0714521990/0718152131/0112835583/0711348282
kamal.embul@gmail.com/lithira2000@yahoo.com

# පිළිගැන්වීම

මිසදුටු නියඟයෙන්
ඉරිතලා ගිය පුහුදුන්
සිත් සතන් සදහම් අමාවැසි වස්වා
සිසිල් කර සත් වගට සෙත් සදිනට
සියවස් කලක් දිගාසිරිසුව ලබත්වා ! යි
පතමින් මේ ධර්ම සංග්‍රහය, ශ්‍රී කල්‍යාණි
යෝගාශ්‍රම සංස්ථාවේ ගරු ප්‍රධාන අනුශාසක
ත්‍රිපිටකාචාර්ය මහා කම්මට්ඨානාචාර්ය
අති පූජ්‍ය නා උයනේ අරියධම්ම මහා ස්වාමින් වහන්සේ
වෙත සාතිශය ගෞරවයෙන් දෙපා
පියුම් නැමද පිළිගන්වන්නේ
අසීමිත ගුරු බැතියෙනි.



ත්‍රිපිටකාචාර්ය, අභිධර්මවිශාරද මහා කම්මට්ඨානාචාර්ය

අති පූජ්‍ය නා උයනේ අරියධම්ම මහා ස්වාමින් වහන්සේ

## නොපෙනේන ලොව සැබෑ තතු තත්වූ පරිද්දෙන් කියා දුන් මහා සංඝ පිතෘවරයාණෝ.

ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ ප්‍රධාන අනුශාසක ත්‍රිපිටකාචාර්ය කම්මට්ඨාන විශාරද අතිපූජ්‍ය නා උයනේ අරියධම්ම මහා ස්වාමීන් වහන්සේ පිළිබඳ නොදන්නා බෞද්ධයකු නැත. නාහිමිපාණන් වහන්සේ වනාහි දැනට ලංකාවේ වැඩවෙසෙන සිල්වත් ගුණවත් සුප්‍රතිපන්නාදී සඟ ගුණයෙන් මොනවට පොහොසත් ත්‍රිපිටක පාලිය කටපාඩමින් දරමින් පෙළ අටුවා අනුව බුද්ධ වචනයට එකඟව දේශනා පවත්වමින් ජනතාව සුමග යවන දෙස් විදෙස් බෞද්ධ ජනතාවගේ ගෞරවාදරයට පාත්‍ර වූ විශාල අනුගාමික ගිහි පැවිදි පිරිසක් ඇති සංඝ නේතෘන් වහන්සේ නමකි. පැවිද්දෙකු තුළ තිබිය යුතු වූ අප්පිච්ඡතා, සන්තුට්ඨිතා, විරියාරම්භතා යන උසස් ශ්‍රමණ ගුණ අභ්‍යන්තරයේ මිස එවන් ගුණ නිරූපණය නොකරන නාහිමි තුමන් වහන්සේ ව්‍යක්තය, විශාරදය, සුවිනීතය, බහුශ්‍රැතය, ධර්ම විනයධරය, ධර්මානුධර්ම ප්‍රතිපන්නය. ශාස්තෘ ශාසනය බෙදා දැක්වීමෙහි, පරිනත දැනුම් ඇති දැකීමෙන් ම ප්‍රසාදය ඇති වෙන ඇසුරු කිරීමෙන් සඟමොක් මඟ නොවරද්දන කල්‍යාණ මිත්‍රයන් වහන්සේ නමකි.

ගල් බොරළු අතර මාණික්‍ය රත්නයක් මෙන් ද, ගස් අතර සඳුන් ගසක් මෙන් ද, ඇතුන් අතර ගජමුතු

සහිත ඇතෙක් මෙන් ද, විරල සත්පුරුෂයන් වහන්සේ නමකි. පැවිද්දේදී අපට ප්‍රව්‍රජ්‍යාචාර්ය වූයේත්, උපසම්පදාවේදී කර්මාචාර්ය වූයේත්, සාරවත් ගුණ ජීවිතයක් ගත කරන නාහිමිපාණන් වහන්සේමය.

2003.03.17 දින කඩුගන්නාව සිරි සිදුහත් භාවනා අසපුවට නාහිමිපාණන් වහන්සේ වැඩමවාගනු ලැබුවේ ''නොපෙනෙන ලොව සැබෑ තතු'' හෙළිකරගැනීම සඳහාය. එහිදී නාහිමිපාණන් වහන්සේ සමඟ කළ ධර්ම සාකච්ඡාව මෙසේ ධර්ම ග්‍රන්ථයක් වශයෙන් ඔබ අතට පත් වේ. කර්මය සතර අපාය යනාදී මාතෘකා ඔස්සේ මෙහි ධර්ම කරුණු විවරණය කෙරෙන අතර භාවනා පිළිබඳව කරුණු ස්වල්පයක් අගට යොදා ඇත්තේ ඉතා සංක්ෂේපයෙනි. ධර්මය නිවැරදිව වටහා ගැනීමට තරම් සම්මාදිට්ඨිය ඇති ශ්‍රද්ධාවන්ත අන්ත භෞතිකවාදිව නොව ධර්මවාදිව සිතන ගිහි පැවිදි සැමට මේ දහම් ලිපි සරණිය ආලෝකයක්ම වේවා!

"නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස"

ඒ භාග්‍යවත් වූ අර්හත් වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා.

# කර්මය

**ජීවිතයට සැපදුක් වේදනා ලබා දෙමින් පුද්ගලයා අනුව ලුහුබඳින එකම ශක්තිය කර්මයයි. කර්මයට යටත් නොවන අයකු විශ්වයේ කොතැනකවත් නැත. ජාති, කුල, ආගම්, පක්ෂ භේදයකින් තොරව කුමන තරාතිරමක අයෙකුට වුවත් කර්මයට මුහුණ දෙන්න වෙනවා. දුගී පැල්පතේ සිට මහා මන්දිර වල සැප විඳින රජතුමා දක්වා සහ අන්ධ බාල පෘථග්ජනයාගේ සිට සිත දියුණු කිරීමෙන් සියල්ල අවබෝධ කළ ලොවුතුරා බුදුරජාණන් වහන්සේ දක්වා මේ සියල්ලන්ගේ ම පසුපස සෙවනැල්ල සේ පැමිණ විපාක දෙන කුසල් අකුසල් කර්ම පිළිබඳ සමාජයේ බොහෝ අයට අවබෝධය අඩුයි. දුකේ දී කනස්සලු වී පිහිට ඉල්ලා යදිමින් නොපෙනෙන බලවේග පසුපස හඹාගොස් දේවාල ගානේ රස්තියාදු වී අමනුස්සයින් සරණ යන්නේ කාලය ශ්‍රමය ධනය නැති නාස්ති කරගනිමින් පශ්චාත්තාප වන්නේ කර්මනියාමය ටිකක් හෝ තේරුම් නොගත් නිසයි. කර්මයේ තතු ජනසමාජය වෙත සමීප කරන්නට කර්මය යනු කුමක්දැයි අප නා උයනේ අරියධම්ම නාහිමියන්ගෙන් විමසූ විට ඊට ලැබුණ පිළිතුර මෙසේය.**

බුදුරජාණන් වහන්සේගේ ධර්මයේ තියෙනවා සර්වඥයන් වහන්සේ නමක් හැර අන් කිසිම කෙනෙකුට සිතා මතා තීරණය කළ නොහැකි කාරණා හතරක්. සිතා නිමකිරීමට නොහැකි නිසා ඒවාට කියනවා "අචින්තනීය" ධර්ම කියලා. ලෝක විෂය, සත්ත්ව විෂය, බුදුරජාණන් වහන්සේගේ ඍද්ධි විෂය සහ කර්ම විෂය, මේවා සිතා නිමකරන්නට බැහැ. නමුත් සර්වඥයන් වහන්සේ දෙසූ ආකාරයෙන්

අපට තේරුම් ගන්නට පුළුවන්. ත්‍රිපිටක ධර්මයෙහි මේ කර්මය පිළිබඳව විස්තර රාශියක් තිබෙනවා. අපි එය කෙටියෙන් විමසා බලමු. කර්මය කියන්නේ අපේ සිතේ පහළවෙන චේතනාවයි. ''**චේතනාහං භික්ඛවෙ කම්මං වදාමි චෙතයිත්වා කම්මං කරොති කායෙන වාචාය මනසා**'' කියලා බුද්ධ වචනයක් තියෙනවා. මහණෙනි, කර්මය කියන්නේ චේතනාවට කියා මම කියමි. යන්න එහි තේරුමයි. අපි චේතනාව කියන්නේ කුමක් ද? කියා පැහැදිළි කර ගනිමු.

**චේතනාව** කියන්නේ අපේ සිතේ පහළවෙන චෛතසික ධර්ම පනස් දෙකෙන් එකක්. අපේ සිතේ පහළවෙනවා චෛතසික ධර්ම පනස් දෙකක්, ඒවා

**සර්ව චිත්ත සාධාරණ**

**ප්‍රකීර්ණක**

**අකුසල**

**සෝභන**

**විරති**

**අප්පමඤ්ඤා**

**ප්‍රඥා**

යනුවෙන් කොටස් කරන්නට පුළුවන්. මේ පනස් දෙකෙන් සර්ව චිත්ත සාධාරණ හත සෑම සිතක් පාසාම යෙදෙනවා. කුසල්, අකුසල්, විපාක ක්‍රියා හැම සිතකම පහළ වෙනවා, අපි ඇසිපිය හෙළනවා කියලා හිතමු. ඒක කායික ක්‍රියාවක්, එතැනින් චේතනාව තියෙනවා. ඇසින් රූපයක් බලන විට කනින් ශබ්දයක් අසනවිට එතැනත් චේතනා තියෙනවා. ගඳක් සුවඳක් විඳිනකොට රසක් නීරසක් විඳිනකොට ස්පර්ශයක් ලබනවිට මේ සෑම විටම චේතනාව තිබෙනවා. පියවර තබනකොට ඇවිදින විට මේ සියලු කායික ක්‍රියාවක් පාසා සෑම වචනයක් පාසා සෑම සිතිවිල්ලක් පාසා චේතනාව තිබෙනවා. ඒ චේතනාව කොටස් දෙකකට බෙදෙනවා.

1. **සහජාත චේතනා**

2. **නානාක්ඛණික චේතනා**

**සහජාත චේතනා** සෑම සිතකම යෙදෙනවා. සහජාත කියන්නේ එකට උපදින කියන එකයි. සිතත් එක්ක එකට ඉපදෙන්නෙ සහජාත චේතනාවයි. මතු විපාක ගෙන දෙන සුගති දුගතිවල දුක් සැප ලබාදෙන චේතනා විසිනවයක් තියෙනවා. අන්න ඒකට කියනවා නානක්ක චේතනා කියලා. විපාක සිත් තියෙන්නෙ සියල්ල තිස්දෙකක්. ක්‍රියා සිත් විස්සක් තියෙනවා. මේ සිත් පනස් දෙකේ චේතනා මතු විපාක දෙන්නෑ. සිත සමග එක්වී ක්‍රියාකාරිත්වයක් සිදු කරනවා පමණයි. මේ චිත්ත චෛතසික ධර්ම ක්‍රියාකාරිත්වයට පමුණුවන්නේ චේතනාව විසිනුයි. මතු විපාක දෙන චේතනා විසිනවය මෙසේ බෙදා ගනිමු.

**අකුසල් සිත් දොළහයි (12)**

**ලෞකික කුසල සිත් දාහතයි (17)**

**(කාමාවචර 8යි, රූපාවචර 5යි, අරූපාවචර 4යි)**

මේ සිත් 29 හි චේතනාව මතු විපාක ගෙන දීමට සමත් වෙනවා මේ චේතනාව බෙදන හැටි.

දැන් අපි ඇහෙන් යමක් දකින අවස්ථාවක් බලමු. ඒ දැකීම සිද්ධවෙන්නේ විපාක සිතෙන්, එයට කියන්නෙ චක්ඛු විඥාන සිත කියලා. ඉස්සරලම අප දැක්ක රූපය අරමුණු කර චක්ඛුද්වාරික චිත්ත වීථියක් පැවැත්වුවා. ඊළඟට මනෝද්වාරයෙන් ඒ සිතින් ගත්ත අරමුණු නැවත නැවත වී මනොද්වාරික චිත්ත වීථියක් පහළ වෙනවා. සතරවෙනුව ඒ දැක්ක දේ පිළිබඳ ව අරමුණු වැටහෙන චිත්ත වීථියක් පහළ වෙනවා. අනතුරුව තමයි දැක්ක දේ ලස්සන නම් හරි ලස්සනයි, හරි වටිනවා, මේක මට ගන්න ඕන, අයිති කරගන්න ඕන යනාදී වශයෙන් ලෝභ සිතක් පහළ වෙන්නේ. අන්න දුටුව දෙයින් ඇලීම් ඇතිවුනා එවිට අකුසල චේතනාවක් සම්පූර්ණ වුනා. අවලස්සන දෙයක්

නම් අප්‍රිය අමනාප අයෙක් නම් අහක බලා ගන්න ඕන වෙනවා. නපුරු සිත් පහළ වෙනවා. ඊර්ෂ්‍යාව පහළ වෙනවා. එවිට ද්වේෂ සහගත අකුසල චේතනා සම්පූර්ණ වෙනවා. මුලින්ම රූපය දකින විට පහළ වුනේ තදබල අකුසල සිතක් නොවේ. තදින් ම අකුසල සිත පහළ වුනේ ඇලීම හෝ ගැටීම ඇති වූ නිසයි. එවිට අකුසල කර්මය සම්පූර්ණ වෙනවා. කුසල පැත්තෙනුත් එහෙමයි. දැන් අප දකිනවා බුද්ධ ප්‍රතිමා වහන්සේ නමක් නැත්නම් භික්ෂූන් වහන්සේ නමක් එහෙමත් නැත්නම් චෛත්‍ය බෝමළු වැනි පූජනීය ස්ථානයක්. එවිට ශ්‍රද්ධාවන්ත කෙනෙකුට නම් ඉස්සර වෙලාම ඇහින් දකින චිත්ත වීථිය පහළ වෙනවා. ඊළඟට මනෝද්වාරයෙන් චිත්ත වීථිය පහළ වෙනවා. තුන්වෙනුව නම තීරණය කර ගන්න චිත්ත වීථිය පහළ වෙනවා. ශෝභන සහගත චිත්ත වීථියක් සතර වෙනුවට පහළ වෙනවා. පස්වෙනුව පහළ වූ චිත්ත වීථියයි බලවත් වෙන්නෙ. මේ අනුව ජවන් සිත් වලදී තමාගේ සිතේ පහළ වන චේතනා කුසල් අකුසල් කර්ම බවට පත්වෙන බව අප තේරුම් ගත යුතුයි. බුදුරජාණන් වහන්සේ කර්මය පිළිබඳව සූත්‍රාන්ත පිටකයේ දොළොස් ආකාරයකට දේශනා කරලා තියෙනවා. ඒවා කෙටියෙන් අපි මෙසේ සලකමු.

සූත්‍ර පිටකයේ ආකාර දොළහා මෙහෙමයි.

**ගරුක, ආචින්න, ආසන්න, කටත්තා** කියලා විපාක දීමේ අනුපිළිවෙල අනුව කොටස් හතරයි. **දිට්ඨ ධම්ම වේදනීය, උපපජ්ජ වේදනීය, අපරාපරීය වේදනීය සහ අහෝසී** යනුවෙන් විපාක දෙන කාල අනුව හතරයි.

**ජනක, උපත්ථම්භක, උපපීලක, උපඝාතක** කියලා විපාක දෙන ආකාර අනුව හතරයි.

**ගරුක කර්මය** කියන්නේ අකුසල පැත්තෙන් පඤ්ච ආනන්තරිය කර්ම සහ නියත මිථ්‍යාදෘෂ්ඨියයි. ආනන්තරීය කර්මයෙන් හෝ නියත මිත්‍යා දෘෂ්ඨියෙන් යුක්ත නම් මරණාසන්න මොහොතේ දී අනිවාර්යයෙන් ඒ කර්මය ඉස්සරහට පැමිණ අවීචියටම ගෙනියනවා. අවීචියට යාමට ගමන් බලපත්‍රය ලැබෙන්නේ මේ පඤ්ච ආනන්තරීය

කර්ම නිසා. සිත රූපාවචර, අරූපාවචර ධ්‍යාන බවට පත් වූවා නම් එය ගරුක කුසල කර්මයයි. අනිවාර්යයෙන් ඒවා සිහිවී සුගතිගාමී වෙනවා. මෙසේ බලවත්ම කුසලා කුසල කර්ම ''ගරුක කර්ම''ලෙස හඳුන්වනවා.

**ආසන්න කර්මය** කියන්නේ යමෙක් මරණාසන්න මොහොතට පත්වී ඉන්න වෙලාවෙ නුවණැති කල්‍යාණ මිත්‍රයෙක් ඔහුට කුසල් සිත් පහළ කර ගැනීමට උදව් වෙනවා. සංඝරත්නය වැඩම කරවලා බණ කියනවා. පිරිත් දේශනා පවත්වනවා. එම කුසල් අරමුණු වීමෙන් මරණාසන්න අවස්ථාවේ පින් සිතුවිලි වැඩී සුගතිගාමී වෙනවා. අකුසල් පැත්තත් එහෙමයි. තමන් පාපයක් කරගෙන තිබුණා නම් එය මරණාසන්න මොහොතේ සිහිවී ආසන්න කර්මය බවට පත්වෙනවා. ඉන් දුගතිගාමී වෙනවා.

**ආචින්න කර්මය** කියන්නේ තමා ජීවිතයේ දී වැඩිපුරම පුරුදු පුහුණු කළ දේවල්. යමෙක් දිනපතාම බුදුගුණ වඩල තියෙනවා නම් ඔහුට මරණාසන්න මොහොතෙ බුදුගුණ සිහිවෙනවා. යමෙක් දිනපතාම මෛත්‍රී වඩලා තියෙනවා නම් මරණාසන්න මොහොතේ ඔහුට අරමුණ වන්නේ මෛත්‍රිය. යමෙක් නිතර පිළිකුල් භාවනාව වඩලා තියෙනවා නම්, විපස්සනා භාවනාව වඩලා තියෙනවා නම්, බුද්ධ පූජා පවත්වලා තියෙනවා නම් මේ විදියට තමා වැඩිපුර පුරුදු පුහුණු කළ දේ මරණාසන්න මොහොතෙදි සිහිපත් වෙලා සුගතියට යනවා. අකුසල පැත්තෙන් යමෙක් වැඩිදුර සතුන් මරලා තියෙනවා, වඩාත් බොරු කියලා තියෙනවා, වඩාත් සුරාපානය කරලා තියෙනවා, වඩාත් පස්පව් දසඅකුසල්හී යෙදිලා තිවෙනවා නම් මේවා අවසන් මොහොතේ සිහිවී අපායට යනවා, මේවට කියන්නේ ආචින්න කර්මය කියලා.

**කටත්තා කර්මය** කියන්නේ ගරුක කර්මයකුත් නැතිනම් ආසන්න කර්මයකුත් නැතිනම් ආචින්න කර්මයකුත් නැතිනම් මේ ජීවිතයේ දී සිදුවී අමතක වූ කර්ම තිබෙනවා පෙර ජාතිවල අපරාපරීය වශයෙන් පැමිණෙන කර්ම තිබෙනවා.එබඳු කර්මයක් පැමිණ පටිසන්ධි ගෙන දෙනවා. ඒවාට කියනවා කටත්තා කර්ම කියලා. මේ විපාක දීමේ

අනුපිළිවෙල අනුව කර්මය සතරාකාර වන අයුරු. විපාකදෙන ආකාර වශයෙන් ද සතරාකාර වෙනවා. (ජනක, උපත්ථම්භක, උපපීලක, උපඝාතක) ඉන් කෙනෙකුගේ පටිසන්ධිය ගෙනදීමට සමත් කර්මය **ජනක** කර්මයයි. පටිසන්ධි ලබාගත්තාට පස්සේ ඒ ජීවිතය පවත්වා ගැනීම සඳහා උපකාර වන කර්මය උපත්ථම්භක කර්මයයි. මේ දෙක හරියට මවයි කිරි මවයි වගේ. මව මා දරුවෙකු කුසේ දරාගෙන බිහිකරන්නේ. කිරි මව තමා ඒ දරුවා හදා වඩාගන්නේ. ඒ වගේ ජනක කර්මයෙන් උත්පත්තිය ලබනවා. උපත්ථම්භක කර්මයෙන් සැපවත් බවට පත්වෙනවා.

**උපපීලක** කියන්නේ විරුද්ධ කර්ම කුසල විපාකයෙන් උපන්න මනුස්සයාට අකුසල විපාක එනවා. රෝගාබාධ, සතුරු කරදර, ධන හානි මෙසේ නොයෙක් විදියට කරදර ජීවිතයට පැමිණෙනවා. මේවා තමා උපපීලක කර්ම කියන්නේ.

**උපඝාතක** කියන්නේ උප්පත්තිය ලබාදුන් ජනක කර්මයේ ශක්තිය තිබියදී මේ ජීවිතයේ දී හෝ සසර දී කරගත් භයානක කර්මයක විපාකයක් ඇවිල්ල ජීවිතක්ෂයට පත් කරනවා. පහනක තෙලුයි වැටියයි දෙකම තිබිය දී සුළඟක් ඇවිත් පහන නිවී යන්නා වගේ එබඳු, කර්ම වලට කියන්නේ "**උපච්ඡේදක**" හෙවත් උපඝාතක කර්ම කියලා. මෙසේ විපාක දෙන ආකාර අනුව කර්මය සතර ආකාර වෙනවා.

මීළඟට විපාක දෙන කාල වශයෙන් ද මෙසේ සතර ආකාරයට බෙදෙනවා. දිට්ඨධම්මවේදනීය කර්ම, උපපජ්ජවේදනීය කර්ම, අපරාපරිවේදනීය කර්ම සහ අහෝසි කර්ම වශයෙන්.

මේ ජීවිතයේ දී රැස් කරන කර්මයන්ගේ කොටසක් මේ ජීවිතයේ දී ලැබෙනවාමයි. එයට "**දිට්ඨධම්මවේදනී කර්ම**" කියා හඳුන්වනවා. එය ද විපාක නොදුනහොත් අහෝසි වෙනවා. උපපජ්ජවේදනීය කර්ම කියන්නේ දෙවෙනි ආත්මයේ නියත වශයෙන්ම විපාකයට පැමිණෙන කර්ම. අපරාපරියවේදනීය කර්ම කියන්නේ තුන්වෙනි ආත්මේ සිට නිවන් දකින තුරු අතරතුර විපාකයට පැමිණෙන කර්ම කොටස.

යම් කර්මයක් විපාක දීමෙන් අවසන් වූවා නම් සහ විපාක දීමට අවස්ථාව නොලැබුණා නම් එබඳු කර්ම සහ රහත්වීමෙන් අවසන් වන කර්ම අහෝසි කර්ම නමින් හඳුන්වනවා. අපි මුලින් කීවා ජවන් සිතේ කර්මයයි විපාක දෙන්නේ කියලා. ජවන් සිතේ පේළියට තියෙනවා ජවන් වාර 7 ක්. එයින් පළමු ජවන් සිතේ කර්ම විපාකය මෙලොව දී ලැබෙනවා. අවසාන ජවන් සිතේ විපාකය ඊළඟ භවයේ දී ලැබෙන්නේ. (උපපජ්ජවේදනීය) මැද තිබෙන ජවන් පහේ මතු භවයන්හි පටිසන්දිවාර ලැබෙන්න පුළුවන් ප්‍රවෘත්ති විපාක නම් අප්‍රමාණ ජාතිවලදී ලැබෙන්න පුළුවන්.

අභිධර්ම පිටකයේ කර්මය 16 ආකාරයට බෙදෙන අයුරු

එය බෙදාගන්න හරිම පහසුයි

**ගති සම්පත්ති**

**උපධි සම්පත්ති**

**කාල සම්පත්ති**

**ප්‍රයෝග සම්පත්ති** යනුවෙන් සම්පත්ති 4 යි.

**ගති විපත්ති**

**උපධි විපත්ති**

**කාල විපත්ති**

**ප්‍රයෝග විපත්ති** යනුවෙන් විපත්ති 4 යි.

(කුසල පැත්තේන් 8යි, අකුසල් පැත්තෙන් 8යි, සියල්ල 16යි.)

**ගති සම්පත්ති** කියන්නේ මනුලොව, දෙව්ලොව සහ බඹලොවයි. මනුලොව දෙව්ලොව උපන්නම බොහෝ විට විපාක දෙන්නේ කුසල විපාකයි. ගති සම්පත්තියේ දී කුසල විපාක මතු වෙනවා. අකුසල විපාක යටපත් වෙනවා.

**උපධි සම්පත්ති** කියන්නේ රූප සම්පන්නව ඉපදීමයි. මනුලොව කෙනෙක් බොහොම රූප සම්පන්නව ආරෝහ පරිනාහ සම්පත්තියෙන්

යුතුව දැකුම්කළු රූප සම්පත්තියක් ඇති ජීවිතයක් ලැබුනම ඒ පුද්ගලයා හැමෝටම ප්‍රිය මනාප වෙනවා. අවම වශයෙන් තිරිසන්ගත සතුන් පවා ලස්සන වී උපන්නම ඔහුට වඩාත් සැලකිලි ලැබෙනවා. මෙබඳු අවස්ථාවලදී අකුසල විපාක යටපත් වී කුසල විපාක මතුවී සැපවත් වෙනවා.

**කාල සම්පත්ති** යනුවෙන් හඳුන්වන්නේ ධාර්මික රජවරු රාජ්‍ය පාලනය කරන කාල, සක්විති රජවරු ඉන්න කාල, ලොව්තුරා බුදුරජාණන් වහන්සේ ලොව පහළ වෙන කාල, කාල සම්පත්තියයි. එබඳු අවස්ථාවල දී අකුසල විපාක යටපත් වී කුසල් විපාක මතු වෙනවා.

**ප්‍රයෝග සම්පත්ති** කියන්නේ යම් කිසි කෙනෙක් නිතර නිතර කුසල් කරනවා, දන් දෙනවා, සිල් රකිනවා, භාවනා වඩනවා, පස්පව් දස අකුසල් වලින් ඈත් වී දස පාරමී ගුණ දියුණු කරනවා, අප්‍රමාණ කුසල් කරනවා, එය ප්‍රයෝග සම්පත්තියයි. ප්‍රයෝග සම්පත්තියේ දී අකුසල් යටපත් වෙනවා, කුසල් විපාක මතු වෙනවා.

**මීළඟට විපත්ති 4 විමසා බලමු.**

**ගති විපත්ති** කියන්නේ සතර අපායේ යම් තැනක ඉපදීම. එබඳු අයෙකුට අකුසල කර්ම ඉදිරියට එනවා. කුසල විපාක යටපත් වෙනවා. උපධි විපත්තිය කියන්නේ මනුලොව යමෙක් ඇහැක් අන්ධව ගොළුවෙලා විරූපීව ඉපදීමයි. එබඳු ඇත්තන්ට කොච්චර පින් තිබුණත් ඒ කුසල විපාක යටවී අකුසල් විපාක මතුවෙනවා. රාජ්‍ය ලබන්නට සිටියත් එබඳු උපධි විපත්තියේ දී රාජ්‍ය පවා අහිමි වෙනවා.

**කාල විපත්තිය** අධාර්මික රජවරුන්ගේ රාජ්‍ය පාළන අවස්ථාවල සහ දුර්භික්ෂ වැනි කර්කෂ කාල වලදි උප්පත්තිය ලැබුවම එයයි කාල විපත්තිය කියන්නේ. එබඳු අවස්ථාවලදී කොච්චර පින් ඇති කෙනෙකු වුවත් එම කුසල විපාක යටවී අකුසල විපාක මතුවෙනවා.

**ප්‍රයෝග විපත්තිය** පාපමිත්‍ර ආශ්‍රය නිසා අයහපත් උපදේශ නිසා තුන්දොරින් ම පව් කරනවා. පස්පව් දස අකුසල්හිම ඇලී ගැලී ජීවත් වෙනවා නම් එයයි ප්‍රයෝග විපත්තිය. ප්‍රයෝග විපත්තියේ දී පින් ඇති කෙනෙකුට වුවත් කුසල විපාක යට යනවා. අකුසල විපාක මතු වෙනවා. මෙසේ අභිධර්ම පිටකයේ කර්මය 16 ආකාරයකට දේශනා වී තිබෙනවා.

**ප්‍රශ්නයඃ කර්මය හටගන්නේ කෙසේද?**

**පිළිතුරඃ** කර්මය කියන එක සෑම චිත්තක්ෂණයකම තියෙනවා. විපාකදීමේ කර්මය තමයි කුසල් අකුසල් චිත්තවීථි වල පහළ වෙන්නේ. මුළු ජීවිතයේ ම සෑම චිත්තක්ෂණයක් පාසා කර්මය පවතිනවා. එහිදී කර්මයක් කුසල හෝ අකුසල බවට පත්වෙන්න මනෝද්වාරයට හෝ චක්ඛුද්වාරයට අරමුණක් සම්මුඛවන්නට ඕනෑ. ඒ සම්මුඛ වීමේදී දැන් අපි හිතමු චක්ඛුද්වාරයට රූප අරමුණක් සම්මුඛ වෙනවා. සම්මුඛ වූ පමණින් කුසලයක් හෝ අකුසලයක් සම්පූර්ණ වෙන්නෙ නැහැ. එතනදි මුලින් ම සිද්ධ වෙන්නෙ භවංගයෙන් සිත අවදිවීමයි. නිදාගත්තක් මෙන් පවතින අක්‍රිය සිත අවදිවෙනවා. ඒකට කියනවා භවංග චලන භවංග උපච්ඡේද කියලා. ඒ දෙකම විපාක සිත් දෙකක්. ඊළඟට චක්ඛුද්වාරයට අරමුණු වූ බැවින් කොයි දොරටුවට ද මේ අරමුණ ඇතිවුනේ කියල විමසීමේ ක්‍රියා සිතක් ඇතිවෙනවා. එයට කියන්නේ පඤ්චද්වාරාවජ්ජන සිත කියලා. ඒ සිතින් හරියට දැනගන්නවා අසවල් දොරටුවයි මේ අරමුණ සම්මුඛ වුනේ කියලා. එතැන දි චක්ඛුවිඥාන සිත පහළ වෙනවා. එයත් විපාක සිතක්. ඒ අරමුණු වූයේ අනිෂ්ඨ අශුභ අරමුණක් නම්, අකුසල විපාක සිතක් ඒ චක්ඛු විඥාන සිත. ඉෂ්ඨ වූයේ නම් කුසල විපාක සිතක් ඒ චක්ඛු විඥාන සිත. ඒ චක්ඛු විඥාන සිතෙන් කෙරෙන්නේ ඊළඟට ඒ චක්ඛු විඥානයෙන් ගත් අරමුණු පිළිගන්න ආකාරයෙන් තව විපාක සිතක් පහළ වෙනවා. ඒකට කියන්නේ සම්පටිච්ඡන සිත කියලා. ඊළඟට පහළ වෙනවා සන්තීරණ කියලා සිතක්. අරමුණ ඉෂ්ඨාරම්මණයක් නම් සෝමනස්ස සහගත සන්තීරණ

සිතක් පහළ වෙනවා. එසේ නැතිනම් උපේක්ෂා සහගත සන්තීරණ සිතක් පහළ වෙනවා. ඒ අවස්ථාවේ දී ත් කුසල් හෝ අකුසල් නැහැ. මීළඟට ඇතිවෙනවා වීථියට හරවන වොත්ථපන කියන සිත. වොත්ථපන සිතෙන් තමා කුසල් පැත්තට හෝ අකුසල් පැත්තට හරවන්නේ. සිත පුරුදු කරලා යෝනිසෝමනසිකාරයට නම් යෝනිසෝමනසිකාරය නිසා වොත්ථපන සිතේ කුසල චිත්තවීථියක් පහළ වෙනවා. දුටු අරමුණු ශුභ හෝ වේවා අශුභ හෝ වේවා ඒකෙන් කුසල චිත්තවීථියක් පහළ වෙනවා. ඒ කුසල චිත්තවීථියට කියනවා වර්තමාන රූපාරම්මණ චිත්තවීථිය කියලා. ඒකෙ කුසල සිත බලගතු නැහැ. ඊළඟට ඇතිවෙනවා මනෝද්වාරික චිත්තවීථියක්. ඒකට කියනවා අතීතාරම්මණ මනෝද්වාරික චිත්තවීථිය කියලා. එතනත් කුසල් චේතනා හතක් ඇති වෙනවා. ඒකත් බලගතු නැහැ. ඊළඟට ඇති වෙනවා මේ දෙකෙහි නම තේරුම් ගැනීමේ චිත්තවීථියක්. ඒකත් මනෝද්වාරිකයි. ඒකත් අර වගේ, ජවන් සිත් බලගතු නැහැ. ඊළඟට ඇතිවෙන්නේ ඒ ගත්ත අරමුණේ ප්‍රයෝජනය සලකන සිත. ඒ සිතෙන් මනෝද්වාරික ජවන් වීථියක් ඇතිවෙනවා. එයත් බලගතු නැහැ. ඊළඟට යෝනිසෝමනසිකාරය පුරුදු පුහුණු කළ සිතක් නිසා කුසල වීථියක් පහළ වෙනවා. ඒ කුසල ජවන් වීථිය තමයි බලගතු කුසලයක් බවට පත්වෙන්නේ. ඒ බලගතු සිත් වල මතුපටිසන්ධිවාර ලබාදීමේ ශක්තියක් තිබෙනවා. ඉන් එහාට තව ඕන තරම් ඒ අරමුණු කරගෙන ජවන් වීථි ඇතිවෙන්න පුළුවන්. ගරු කටයුතු කුසල කර්මයක් නම් නැවත නැවත බොහෝ කුසල් අරමුණු රාශියක් පහළ වෙනවා. නිදසුනක් කියනවා නම්, මේ දේශනාවෙත් සඳහන් වෙලා ඇති එක මලක් පූජා කරලා ආත්මභාව අසූකෝටියක් සුගතියේ උපන්න චරිතයක් ගැන. එවිට එතැන්දි සිදුවුනේ එය ගරු කටයුතු කුසලයක් නිසා නැවත නැවත කුසලය අරමුණු කරගෙන චිත්තවීථි ඇතිවීමයි.

**ප්‍රශ්නයඃ කර්මය පවතින්නේ කොහේද?**

**පිළිතුරඃ** කර්මය පවතින ආකාරය මෙහෙමයි. එහිදි කර්මය පවතින තැනක් නැහැ. චිත්තක්ෂණයෙන් චිත්තක්ෂණයට කර්ම ප්‍රත්‍ය, උපනිශ්‍රය

ප්‍රත්‍ය යන දෙක මුල් කොට අනන්තර, සමානන්තර, අනන්තර උපනිශ්‍රය නත්‍ථි, විගත කියන සෑම සිතකම තියෙන ශක්ති විශේෂ සිතක් නිරුද්ධ වීමේ දී අනිත් සිතට භාරදීලයි නිරුද්ධවෙන්නේ. සිතට රැඳෙන්න තැනක් නැහැ. සිතෙන් සිතට සිතෙන් සිතට මාරු වෙමින් ප්‍රත්‍ය වෙවී තමා කල්ප ගණන් මේ කර්ම ශක්ති විශේෂ පවතින්නේ, යම්කිසි ආරක්‍ෂක නිලධාරියෙකු තමාගේ දවසේ සේවා කාලයෙන් සමුගන්නේ ඒ වෙනුවට තවත් අයෙකු සේවයට වාර්තා කිරීමෙන් පසුව ඒ කටයුතු ඔහුට පැවරීමෙන් අනතුරුවයි. ඒ වගේ එක සිතක් නිරුද්ධ වෙන්නේ ඒ සිතේ පවතින කර්ම ශක්ති අනිත් සිතට භාරදීමෙන් පසුවයි. මේ ජීවිතයේ සිතෙන් සිතට සම්බන්ධ වූ කර්ම ශක්ති අනතුරුව පටිසන්ධි සිතට ලැබීමෙනුයි ඊළඟ භවයට කර්ම ශක්ති ගමන් කරන්නේ. මරණයට පත්වීමේ දී රූපකාය මෙහි රැඳුනට නාමකාය රැඳෙන්නේ නෑ. නාමකාය අවසන් වෙන්නේ රහත්වෙලා පිරිනිවන් පෑමෙන් පස්සේ. ඒ තාක් මේ චිත්ත චෛතසික පරම්පරා නොසිඳී පවතිනවා. එසේ හෙයින් අහසේ හෝ වෙනත් තැනක මේ කර්මය රැස්වී පවතිනවා නොව තම තමන්ගේ චිත්ත සන්තානය තුළමයි කර්මය රැස්වෙන්නේ. සිතෙන් සිතට ප්‍රත්‍ය වෙවී පැවතීම නිසයි කර්මශක්ති ඉදිරියට ගොස් සසරට ගමන් කරන්නේ.

**ප්‍රශ්නය: කර්මය ක්‍ෂය වන්නේ කවදාද?**

**පිළිතුර:** කර්මය ක්‍ෂය වීමේ ක්‍රම දෙකක් තියෙනවා. යම්කිසි කර්මයක් විපාක විඳ අවසන් නම් ඒ කර්මය ක්‍ෂය වෙනවා. එහෙම නැත්නම් රහත්වෙලා අරහත් මාර්ග සිත පහළ වීමේදි මතු භවයක ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති විපාක දීමේ කර්ම ක්‍ෂය වෙනවා. රහත් වූවත් පිරිනිවන් පාන තුරු යම් යම් කර්ම වලට මුහුණ දෙන්න සිදු වෙනවා. පිරිනිවන් පෑමේ දී සියලු කර්ම ක්‍ෂය වෙනවා.

**ප්‍රශ්නය: වඩා ප්‍රබල වන්නේ දැන දැන කරන කර්මය ද නොදැන කරන කර්මය ද?**

**පිළිතුර:** මෙය කුසල් ද අකුසල් ද කියා නොදැන කරන කර්මයේ බරපතලකම වැඩියි. මේකෙන් පාපයක් නෑ කියලා හිතලා පාපයක්

කිරීමේ දී එතැන දිට්ඨිය නිසා පාපයේ බරපතලකම වැඩියි. වරදක් වෙනවා කියලා දැන දැන කරන කොට කර්මය ටිකක් දුබලයි. අනික කර්මය සඳහා යෙදෙන චේතනා මහන්තතාවය අනුව කර්මය බරපතල වෙනවා. මැස්සෙක් මදුරුවෙක් මරණ විට ඇතිවෙන අකුසල චේතනා බොහොම කෙටි වෙලාවයි. අලියෙක් ඇතෙක් මිනිසෙක් මරණ කොට චේතනා ගොඩක් ඇතිවෙනවා. එතකොට පාපය මහාසාවද්‍ය වෙනවා. පිනක් වුවත් එහෙමයි. අපි මලක් පූජා කරනවා. කෙටි වෙලාවනෙ ගතවෙන්නේ. ඊට වඩා දීර්ඝ වේලාවක් භාවනා කිරීමේ දී පෙරට වඩා මහා සාවද්‍ය කුසලයක් වැඩෙනවා. වැඩි චිත්ත චෛතසික පරම්පරාවක් ඇති වූවා නම් ඒක තමා බරපතල වන්නේ.

කුසල පක්ෂය දැන දැන කිරීමේ දී ආනිශංස වැඩියි. අකුසල පැත්තෙ නොදැන කරන කොට අකුසලය වැඩියි. දැන් අනාගාමික කෙනෙක් කර්මඵලය පිළිගන්නේ නැහැනේ. එය නියත මිථ්‍යා දෘෂ්ඨියක්. ඒ නියත මිථ්‍යා දෘෂ්ඨියේ සිට කරන පාපය බරපතලයි. කර්මය කර්මඵලය පිළිගන්න කෙනෙක් අත්වැරැද්දකින් නැත්නම් හදිසි කෝපයකින් ප්‍රාණඝාතයක් කරනවා. නමුත් ඔහු මිථ්‍යා දෘෂ්ඨියේ පිහිටලා නැහැ. එනිසා ඔහු ගේ කර්මය අච්චර බරපතල නැහැ. රත්වූ යකඩයක් කෙනෙක් දැන දැන අල්ලනවා, රත්වූ බව දැන දැන ඇල්ලීම නිසා එතරම්ම හානියක් වන්නේ නැහැ. තව කෙනෙක් රත්වූ වග නොදැන අල්ලනවා. එවිට බොහෝ සෙයින් අත දැවෙනවා. එපරිද්දෙන් දැන දැන පාපයක් කිරීමේ දී පහළ වෙන චේතනා වලට වඩා කර්මය කර්ම ඵලය නොපිළිගන්නා කෙනෙක් පාපයක් බව නොදැන කිරීමෙන් බරපතල පාපයක් කරගන්නවා.

**ප්‍රශ්නය: අපි යමක් සිතින් සිත සිතා ඉන්නවා කයින් ක්‍රියාත්මක වීමක් නෑ. එතැනත් චේතනාවක් තියෙනවා. ඒ චේතනාව සහ කයින් ක්‍රියාත්මක වීමේ දි ඇතිවෙන චේතනාව අතර වෙනස කුමක්ද?**

**පිළිතුර:** කයයි වචනයයි දෙක සිත නැතිව ක්‍රියා කරන්නේ නෑ. කායික වාචසික හැම ක්‍රියාවක් ම සිතින් තමයි නිපදෙන්නේ. සිත ප්‍රධානව

මනෝද්වාරයෙනුයි පඤ්චද්වාරයට අයිති කුසල් අකුසල් පහළ වෙන්නේ. කයින් සිදුවන අකුසල කර්ම හෝ කුසල කර්ම තියෙනවා නම් එය කායද්වාරික කීවාට කයින් ක්‍රියා කරමින් මනෝද්වාරයෙන් තමයි කර්මය රැස් වුනේ. දැන් අපි නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස වචනයෙන් කියනවා. එවිට ඒක වාග්ද්වාරික කුසලයක් නමුත් කුසල සිත පහළ වුනේ මනෝද්වාරයෙන් තමයි කර්මය රැස්වුනේ. දැන් අපි නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස වචනයෙන් කියනවා. එවිට ඒක වාග්ද්වාරික කුසලයක් නමුත් කුසල සිත පහළ වුනේ මනෝද්වාරය ආශ්‍රය කරගෙන හෘද වස්තුව ආශ්‍රය කරගෙන. දැන් අපි වන්දනා කරන අවස්ථාවක් සලකා බලමු. එය කාය ද්වාරයෙන් ක්‍රියා කිරීමක්. නමුත් සිතින් තමයි එතන කුසලය සිද්ධ වෙන්නෙ. හැම වෙලාවෙම කායද්වාරය උනාට වාග්ද්වාරික උනාට එතැන ක්‍රියාකාරී වෙන්නෙ මනසයි. එනිසා හැම වෙලාවෙම සිතේ තමයි කුසල් අකුසල් පහළ වෙන්නේ.

**ප්‍රශ්නයඃ අපි දන්දීමට කලින් දන්දීම් පිළිබඳව සිතනවා. සිල් රැකීමට කලින් ඒ ශීලය පිළිබඳව සිතනවා. මෙසේ පිනක් කිරීමට කලින් ඇතිවෙන කුසල් සිත් සහ එය ක්‍රියාවට නැගීමේදී ඇතිවෙන කුසල් සිත්වල විපාක ඇති වෙන්නේ කොහොමද?**

පිළිතුරඃ එතැනදී පූර්වභාග චේතනා තමයි ක්‍රියා කරන්නෙ. ඉස්සර මුලින් පහළ වුන ඒවත් කුසල් චේතනා කර්ම නමින් හඳුන්වනවා. එම සිතින් සිතූ දෙය ක්‍රියාත්මක වීමේදී කර්ම පථ බවට පත්වෙනවා. එය පටිසන්ධි ගෙන දීමට සමත් ප්‍රබල කුසලයක් වෙනවා. කර්මපථ බවට පත්වූ ප්‍රබල කුසලයෙන් භවයක පටිසන්ධි විපාක ලබාදෙන අතර පළමු පූර්ව භාග චේතනා සමූහයේ විපාක මතුභවයන්හි ප්‍රවෘත්ති විපාක ගෙන දෙනවා.

# පින සහ කුසලය

**ප්‍රශ්නයඃ අවසරයි ගරු කටයුතු ස්වාමීන් වහන්ස, පින සහ කුසලය කියන වචන දෙක අප නිතරම අසා පුරුදු වචන දෙකක්. අප මේ වචන දෙක පිළිබඳ ඇතැම් ස්වාමීන් වහන්සේලාගෙන් විමසුවාම පින යනු ලෞකික සැප සම්පත් උදෙසා කරන යහපත් දේ වශයෙන් සහ කුසල් යනු ලෝකෝත්තර සැප පිණිස කරන යහපත් දේ වශයෙන් තෝරා දෙනු ලැබුවා. එසේ අප එය පිළිගැනීමේ වරදක් තිබෙනවා ද?**

පිළිතුරඃ බොහෝ දෙනෙක් මගෙන් ඔය ප්‍රශ්නය අහනවා. ඔය ප්‍රශ්නය ආරම්භවුන තැනත් මම දන්නවා. දකුණු පළාතේ ප්‍රසිද්ධ විහාරස්ථානයක බොහොම දැන උගත් නායක ස්වාමීන් වහන්සේ නමක් තමා මුල්වරට ඔය අදහස බෞද්ධ ජනතාවට දුන්නේ. අපි මේ ගැටළුව විසඳාගත යුත්තේ අභිධර්ම පිටකයේ සහ සූත්‍ර පිටකයේ මෙන්ම ත්‍රිපිටකය පුරා දක්නට ලැබෙන හේතු නිරුක්ති සහ උදාහරණ කෙරෙහි අවධානය යොමු කිරීමෙනුයි.

අපේ බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයෙන් හත්වැනි වර්ෂයේ දී තව්තිසා භවනට වැඩ අභිධර්ම දේශනාව පැවැත්වූවා. ඒ දේශනාවේ දී ලෝකයේ තියෙන ධර්මතාවන් ඉතුරුවක් නැතිව දේශනා කළා. සිත පිළිබඳවත් සියල්ලම එතනදි දේශනා වුණා. සිත පිළිබඳ සියලුම දේශනා තියෙන්නේ ධම්ම සංගණිප්‍රකරණයේ චිත්තෝත්පාද කාණ්ඩයේ. ලෝකයේ සිටින සියලුම සතුන්ගේ කුසල් සිත් එක්කාසු කළොත් චිත්තෝත්පාද විසි එකකට එකතු වෙනවා. සම්පිණ්ඩනය වෙනවා. ඒ කියන්නේ කාමාවචර මහා චිත්තෝත්පාද අටයි. රූපාවචර චිත්තෝත්පාද පහයි. අරූපාවචර මහා චිත්තෝත්පාද හතරයි. ලෝකෝත්තර චිත්තෝත්පාද හතරයි. ඒ හැම තැනකම කියවෙන්නේ කුසලා ධම්මා අකුසලා ධම්මා

කියලමයි. චක්ඛුද්වාර සෝතද්වාර දොරටු හයෙන් ම මේවා සිද්ධ වෙන ආකාරය දේශනා කරලා තියෙනවා. රූපාරම්මණය සද්දාරම්මණය ආදී සියල්ලෙන්ම කුසල් සිත් පහළ වෙන ආකාරය දක්වලා තියෙනවා. ඒ හැර මොනම තැනකවත් ධර්මයේ "**පුඤ්ඤා ධම්මා**" කියලා අමුතු සිත් කොටසක් තියෙන වග මම නම් දන්නේ නැහැ.

පුඤ්ඤ (පින) සහ කුසල් කියන වචන දෙකම ධර්මයේ සඳහන් වෙනවා. එහෙත් ඔය වචන දෙක ධර්මතා දෙකක් හැටියට තේරුම් ගැනීම මිථ්‍යාවක්. අපි නිදසුනක් වශයෙන් මෙසේ සිතමු. අපි හැන්දෑවේ අඳුර වැටීගෙන එනවිට පහන් දැල්වීමේදී පෙර පසු නොවී ක්‍රියාකාරී දෙකක්  සිදුවෙනවා. එකක් අඳුර නැසීම අනික එළිය පැතිරීම එකම පහනේ ක්‍රියාකාරී දෙකයි. මේක පෙර පසු නොවීම සිදු වෙනවා. ඉර පායන විටත් එසේමයි. ඒ වාගේ එකම වස්තුවේ එකම සිතේ ක්‍රියාකාරීත්වයන් විවිධාකාරයෙන් සිදුවෙනවා. -

අපි පහනට නම් දෙකක් කියනවා. එළිය පතුරවන අර්ථයෙන් **පදීපො, පජ්ජොතෝ** කියනවා. අඳුර නසන අර්ථයෙන් තමොනුදො, තමධංසි කියා කියනවා. පහන් පිදීමේ ගාථාවෙන් කියවෙනවනෙ දීපෙන තමධංසිනා (අඳුර නසන මේ පහනින්) කියලා. එවිට එකම පහනට ඇයි මේ නම් දෙකක් කියන්නේ. ඒකෙ ක්‍රියාකාරී දෙකක්  තියෙන නිසා. ඒකට අට්ඨකථා වල කියන්නේ යථාවසරසලක්ෂණය කියලා. යථාවසරසලක්ෂණය කියන්නේ හිත ඇති හිත නැති සෑම දෙයකම තියෙනවා ස්වභාවලක්ෂණ පඨවි ධාතුවේ තද ලක්ෂණය. තේජෝ ධාතුවේ සීතල, උෂ්ණ ලක්ෂණ. වායෝ ධාතුවේ සෙලවෙන පිම්බෙන ලක්ෂණ තියෙනවා. යථාවසරසලක්ෂණය කියන එකේ කෙටිම තේරුම එහි ස්වභාවය අනුව නම්තැබීම කියන එකයි. එබඳු ස්වභාව අනුව සිතට යෙදෙන නම් දහයක් තිබෙනවා. චින්තනාර්ථයෙන් චිත්තං කියනවා. අරමුණ මැනගන්නා අර්ථයෙන් මනො කියනවා. මනසං කියන්නෙත් ඒ අර්ථයමයි. අදහස් දරණ අර්ථයෙන් හදයං. පිරිසිඳු අර්ථයෙන් පණ්ඩරං. ආයතනාර්ථයෙන් මනායතන. අරමුණු ගැනීමේ ප්‍රධාන අර්ථයෙන්

මනින්ද්‍රියං. අරමුණු විශේෂයෙන් දන්නා අර්ථයෙන් විඤ්ඤාණං. අරමුණු විශේෂයෙන් දැනගන්නා රැසක් නිසා විඤ්ඤාණක්ඛන්ධො. අරමුණු ආදී ප්‍රත්‍යයන්ට සාධාරණ නිසා තජ්ජාමනොවිඤ්ඤාණ ධාතු කියා කියනවා. මෙසේ සිත හඳුන්වන නම් දහයක් තියෙනවා. චිත්තං, මනො, මනසං, හදයං, පණ්ඩරං, මනායතනං, මනින්ද්‍රියං, විඤ්ඤාණං, විඤ්ඤාණක්ඛන්ධො, තජ්ජාමනොවිඤ්ඤාණ ධාතු කියන කොයි නම කීවත් සිත සිතමයි. මෙසේ මේ එකම සිතට නම් දහයක්ම ලැබුණේ යථාවසරසලක්ෂණය නිසා. ප්‍රඥාවට එසේ ලැබෙන නම් තිහක් තිබෙනවා. ඒ වාගේ කුසලය හා පින කියන වචන දෙකින් එකම සිතේ ක්‍රියාකාරී අර්ථ දෙක් හඳුන්වනු ලබනවා.

''**කුස සංඛතෙ පාපකෙ අකුසලෙ ධම්මෙ සලයන්ති චලයන්ති කම්පෙන්ති විද්ධංසෙන්තීති කුසලං**'' පාප ධර්මයන්ට කියනවා කුස කියලා නින්දිතාර්ථයෙන්. අනික සැපය කපාදමන අර්ථයෙන් ද කුස කියා කියනවා. සියලු සම්පත් විනාශ කරන අර්ථයෙන් ද පාපයන්ට කුස කියනවා. කුස නම් වූ අකුසල කර්ම කපාදමන්නේ, සොලවා දමන්නේ, කම්පා කරන්නේ, සුණු විසුණු කරන්නේ, යම් ධර්මතාවයක් ද එය කුසල කියා හඳුන්වනවා. සිතේ පහළවීමට තියෙන අකුසල් නසන අර්ථයෙන් ද කුසල් නම් වෙනවා.

එතකොට **පුඤ්ඤ** හෙවත් පින් කියන එකේ තේරුම මෙහෙමයි. **හදයං පුනාතීති පුඤ්ඤං** චිත්ත සන්තානය පිරිසිඳු කරන අර්ථයෙන් පින කියලා කියනවා. සමහරු මේක තෝරනවා සිත පිනවීම පිනය කියලා. එසේ තේරීම වැරදියි. **හදයං පුනාතීති පුඤ්ඤං** කියන්නේ පිනවීමක් ගැන නෙවෙයි. සිත පිරිසිඳු කරන අර්ථයෙනුයි පින කියන්නේ. පිනවන අර්ථයක් මෙහි තියෙනවා නම් **පීනෙතීති පුඤ්ඤං** වෙන්න ඕනනෙ. සිතේ හටගෙන තියෙන ලෝභ, ද්වේෂ, මෝහා දී ක්ලේශ ගත් දුරුවීම කුසල නම් වන අතර සිත පිරිසිඳු වීම පින් නමින් හඳුන්වනු ලබනවා. එකම වෙලාවේ එකම සිතින් මේ දෙකම කෙරෙනවා. අර

එළිය වැටීමයි අඳුර නැසීමයි වගේ. සිතේ පහළ වීමට තිබෙන ලෝභා දී උපක්ලේශයෝ පහළ නොවෙන කොට සිත පිරිසිදු වෙනවා. මළ බැඳෙන අපිරිසිඳු පිත්තල භාජනයක් යම්කිසි දෙයකින් පිරිසිඳු කරනවා. එවිට මොකද වෙන්නේ? කහට දූවිලි ඔක්කොම ඉවත්වෙලා පිරිසිදු වෙනවා. දීප්තිමත් වෙනවා. ඒ වගේ එකම කුසල් සිතෙන් ඔය ක්‍රියාකාරී දෙකම සිදුවන බැවින් ඒකට කියනවා පින ය, කුසලය කියලා. ඒක නම් දෙකක් මිසක් ධර්මතා දෙකක් නෙමෙයි.

දැන් සමහර කෙනෙක් ලෞකික සම්පත් උදෙසා කරන යහපත් දේ පිනයි, දස කුසලධර්ම කුසලයි කියලා ඔහොම තෝරන්න යනව. දාන, සීල, භාවනා, අපචායන, වෙයාාවච්ච ඔය ඔක්කොම සම්මුති නාම පමණයි. ඒවට දස පුණාක්‍රියා කීවට එතැන කුසල අර්ථය තියෙනවා. අනිත් ඒවත් එහෙමයි. පාණාතිපාතා වෙරමණි කියන විට දස කුසල ධර්මයෙන් එකක්. සතුන් මැරීමෙන් වළකින්නෙමි යි කියන විට සිත පිරිසිඳු වෙනවා. කෙලෙස් නැති වෙනවා. ඒක පිනක් කියන්නත් පුළුවන් කුසලයක් කියා කියන්නත් පුළුවන්. ඉතිං ඔය අර්ථ විග්‍රහය කරනවා විනා මේක දෙකක් හැටියට ගන්න ගියොත් එය මිථ්‍යාවක් වැරදීමක් බව අප තේරුම් ගන්න ඕන. එසේම මෙය අන් අයට නිවැරැදිව ප්‍රකාශ කරන්නත් ඕන. සිත පිරිසිඳු කරන අර්ථයෙන් පින කියනවා, කෙලෙස් නැති කරන අර්ථයෙන් කුසල කියනවා. පින කීවත් කුසලය කීවත් ධර්මතා වශයෙන් එකක් මිස දෙකක් නෙවෙයි.

**ප්‍රශ්නය: කෙනෙකු රැස් කළ පින් අන් අයට අනුමෝදන් කිරීම අප අසා පුරුදු දෙයක්. දසපින්කිරියවත් පිළිබඳ කතා කිරීමේදී පත්තිදාන යනුවෙන් එය හඳුන්වනවා. පින් අනුමෝදන් කිරීමට අනුමොදන් වීමට පිළිවන් වන්නා සේම පාපයත් අනුමෝදන් කිරීමට සහ අනුමෝදන් වීමට හැකිද?**

**පිළිතුර:** පින් අනුමෝදන් කරන්න පුළුවන් වගේම පාපයත් අනුමෝදන් කරන්න පුළුවන්. දැන් බලන්න අපේ සමහර පැරණි අය කියනවා මං ඉසේ කෙස් ගාණට ගෝන්නු මරලා තියෙනවා, මම ඉසේ කෙස් ගාණට

රා බීලා තියෙනවා. ඒක අහන තවත් වෙන මනුස්සයෙක් හරි මිනිහෙක් තමයි කියලා බොහොම සතුටු වෙනවා. අන්න අකුසල් අනුමෝදන් වුනා. ගාථාවකුත් ඕන නම් හදා ගන්න පුළුවන්. කෙනෙක් කියනවා මම අර මිනිහට හොඳ පාඩමක් අද ඉගැන්වුවා. ගහලා ඇට කටු කුඩුවෙන්න තරම් දඬුවම් දුන්නා කියලා. ඒක අහන කෙනා කියනවා බොහොම හොඳයි. එයාට ඔහොම කරලා මිදි මරන්නයි වටින්නේ මමත් හිටිය නම් දෙකක් අනිනවා කියලා. අන්න පව අනුමෝදන් වුනා. ත්‍රස්තවාදියෙක් වෙඩි තියලා මරල දැම්ම කිව්වම අපේ සිංහලයෝ බොහොම සතුටුවෙලා අර පාපය අනුමෝදන් වෙනවා. අනවබෝධය නිසා අද බොහෝ දෙනෙක් පින් අනුමෝදන් වීමට වඩා කරන්නේ අනුන්ගෙ පව් අනුමෝදන් වීම.

බෝසතාණන් වහන්සේ පෙර ජාතියක මාළු මරණ කුලයක උපන්නා ගඟක් අයිනේ. එක දවසක් තවත් ළමයි සමඟ මාළු මරණවා බලන්න ගියා. ගිහින් බැලුවාම එදා ඒ ගමේ නෑයො පෙර දවසෙ ගඟට වස වගයක් දාලා විශාල ප්‍රමාණයක් මාළු ගොඩ දාලා. ඒ දැකලා මේ බෝසත් දරුවා කියනවා අදනම් හරිම හොඳයි ලොකු මාළු ගොඩක් ගොඩදාලා කියලා. අන්න පාපය අනුමෝදන් වුනා. ඒ පාපය අනුමෝදන් වීම නිසා බුදු බවට පත්වීමෙන් පසුවත් හිසරදයක් පැවති බව ධර්මයේ සඳහන් වෙනවා. මෙසේ අකුසලය අනුමෝදන් වෙන්න ඕන තරම් පුළුවන්.

කුසලය නිසා කුසල් සිද්ධ වෙනවා. කුසලය නිසා අකුසල් සිද්ධ වෙනවා. ඒ වගේම අකුසලය නිසා කුසල් සිද්ධ වෙනවා. අකුසලය නිසා අකුසල් සිද්ධ වෙනවා. ඔය ක්‍රම හතරම ලෝකයේ පවතිනවා. යම්කිසි පුද්ගලයෙක් දානයක් දෙනවයි කියලා හිතමුකො. තවත් කෙනෙක් එය බලා අනේ සාදු සාදු කොච්චර වටිනා පිනක් ද කළේ කියලා සතුටු වෙනවා. අන්න කුසලයෙන් කුසලය සිද්ධවුනා. එබඳු පින්කමක් දැකලා

තව සමහර විට කෙනෙක් අපොයි ඔය උපාසකයගේ හැටි මම දන්නවා දැන් ඔය පන්සල් ගියාට එයා මහ කපටියෙක්, පච්කාරයෙක්, මහබොරුකාරයෙක් සල්ලිකාර කමට මාන්නෙට කරන වැඩ කියලා හිත නරක්කර ගන්නවා. අනුන් කරන කුසලය නිසා තමා අකුසලයක් කර ගන්නවා.

තව කෙනෙක් අපි හිතමු යම් අකුසලයක් කරනවා. එය අහන්න දකින්න ලැබුණම අනේ ඒ මනුස්සයා මොන තරම් අපරාධයක් ද කළේ. මේ උදවියට කල්‍යාණ මිත්‍ර ආශ්‍රය ලැබී ධර්මය අවබෝධ වී මේ අකුසල් වලින් මිදේවා. සුගති මග නිවන් මග ලැබේවා යනාදී වශයෙන් ඒ උදවියට මෛත්‍රී කරලා මම නම් කවමදාවත් මෙබඳු පාපයක් කරන්නේ නැහැ. සසර වසන තුරු මගෙන් මෙබඳු පාපයක් සිදු නොවේවා. කියල හිතලා අනුන්ගෙ අකුසලයෙන් තමා කුසලයක් සිදුකරගන්නවා. අකුසල් කරන දුසිරිතේ හැසිරෙන කෙනෙක් පිළිබඳ අහන්න දකින්න ලැබුනම අර මුලින් කීවා වගේ හරිම වටිනවා බොහොම හොඳයි එහෙම කරපු එක මමත් හිටියනම් ඒකමයි කරන්නේ කියලා අනුන් කළ නරක දේ අනුමත කරනවා. එයින් අනුන්ගෙ පාපයට තමනුත් සම්බන්ධ වෙනවා. පාපයෙන් පාපයක් සිදුකර ගන්නවා.

තමන් ගැනත් එහෙමයි. තමන් කුසලයක් කරලා දානයක් දීලා, ශීලයක් රැකලා, භාවනා වඩලා හිතනවා අනේ සාදු! සාදු! ගතවූ කාලය තුළ දී මම මේ වගේ බොහෝ කුසල් කළා. එහෙත් මම කියා කෙනෙක් නෑ. නාම රූප දෙකක් පමණයි. ඒ නාමරූප ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිව නැතිව යන නිසා අනිත්‍යයි, දුක්ඛයි, අනාත්මයි කියලා හිතනවා. අන්න කුසලයෙන් කුසලය රැස්කළා. සමහරු කියනවා මම තමයි ඒ පින්කම කළේ. මේ පළාතේ වෙන කවුද එවැනි විශාල පින්කම් කරන්නේ කියලා මාන්නයට බර සිතිවිලි සිතනවා. එහෙම නැත්නම් මට මේ කුසලයෙන් මේ විදියට ලොතරැයියක් ඇදෙන්න ඕනෙ. යානවාහන ලැබෙන්න ඕනෙ කියල ලෝභයට බර සිතිවිලි සිතනවා. මෙසේ තණ්හා,

දිට්ඨි, මාන ආදී කෙලෙස් උපදවා ගන්නවා. එයින් තමාගේ ම කුසලය නිසා අකුසල් රැස්කරනවා. තමාගෙන් අකුසලයක් සිදුවුනාම කුමක් හෝ වැරැද්දක් සිදු වූනාම ඒ ගැන සංවේගය උපදවා ගන්නවා.

නැවත එබඳු වැරදි නොකරන්න අධිෂ්ඨාන කරනවා. එවිට අකුසලය නිසා කුසලයක් වැඩෙනවා. හැබයි තමාගෙන් සිදු වූ පාපය පිළිබඳ පසුතැවිලි වීම පිනක් වන්නෙ නැහැ. එසේ පසුව පාපය ගැන සිතා කණගාටු වීම දුක්වීම පාපයක්, නීවරණයක්.

ඒ වගේම යමෙක් තමාගෙන් සිදුවන අකුසලයක් ගැන සිතා සතුටු වෙනවා. මම එදා මෙහෙම බොරුවක් කීව ඒකට එයා රැවටුනානේ කියලා හිතනවා. බොහොම සතුටින් තමාගේ පාපය නැවත නැවත සිහිකරනවා. එවිට පාපය නිසා අලුතින් පව් උපදිනවා. මේ නිසා පාපය පිළිබඳ නිසි අවබෝධයක් නොවීම නිසා තව තව පව් එකතු කරගෙන සසර දුකට පත් වෙනවා. ඒ නිසා අපි අනුන් කරන හොඳ දේ අනුමත කළාට නරක දේ අනුමත කිරීමට එයට අනුබල දීමට හොඳ නැහැ.

# අපාය තියෙන්නේ කොහේද?

**ප්‍රශ්නය: අවසරයි ගරු කටයුතු ස්වාමීන් වහන්ස, මා මීළඟට බලාපොරොත්තු වෙන්නේ මේ වර්තමාන සමාජයේ බහුතරයක් බෞද්ධයො නගන ප්‍රශ්නයක් විමසීමටයි. එනම් කර්ම විපාක පිළිබඳ කථා කිරීමේ දී සමහරු සතර අපාය දෙව්ලොව බඹලොව ප්‍රතික්ෂේප කරනවා. ඔවුන් කියන්නේ අපාය දෙව්ලොව තියෙන්නේ මේ මනුස්ස ලෝකෙ කියලයි. බටහිර තාලයට හිතන නවීන විද්‍යාව කරපින්නාගෙන භෞතිකවාදීව සියල්ල බලන එබඳු පුද්ගලයින්ට දෙන පිළිතුර පැහැදිළි කළොත්?**

පිළිතුර: ඒක ඉතාමත් වැදගත් ප්‍රශ්නයක්. බොහෝ දෙනා ඇහැට පේන දේ ගැන විතරනේ පිළිගන්නේ. ඒ ඇත්තෝ මේ ඇහැට පේන දේ ගැන විතරයි හිතන්නේ. පැරණි උපමාවක් තියෙනවා ''**කූපමණ්ඩුකො**'' කියලා. කූපමණ්ඩුක කියන්නේ ළිඳේ ඉන්න මැඩියා. ඔහු හිතනවා මම තමයි මුළු සාගරයටම නායකයා කියලා. මේක තමයි විශාලම ජලාශය කියලා එහෙම හිතලා හයියෙන් නාද කරනවා. ඒ වාගේ සාමාන්‍ය පෘථග්ජන ජනතාව බුදුබණ ගැන විශ්වාස නැති අය දෙව්ලොව, බඹලොව, අපාය සතර තියෙනවා කියලා විශ්වාස කරන්නේ නෑ. නමුත් අපේ බුදුරජාණන් වහන්සේ සර්වඥයි. සර්වඥ බැවින් අපි අපේ බුදුරජාණන් වහන්සේ දෙසූ දේශනාව ගෞරවයෙන් පිළිගන්නවා. සැදැහෙන් විශ්වාස කරනවා. ශ්‍රද්ධාව කියන්නේ එයයි. විශ්වාසය පිළිගැනීම ශ්‍රද්ධාවයි. අපේ බුදුරජාණන් වහන්සේ දේශනා කරල තියෙනවා දෙව්ලොව, බඹලොව, සතර අපායට යන පාර හදාගන්නේ මනුලොව දි බව, මනුලොවට යන පාර හදාගන්නෙත් මනුලොව දී මයි. අපායට යෑමට හේතු වන අකුසල් රැස්කරන්නෙ මනුලොවදී. අපාය තියෙන්නේ මනුස්ස

ලෝකේ කීවොත් මනුස්ස ලෝකේ සිට කරන අකුසල් විපාක දීමට තැනක් නැතිව යනවා ඒ නිසා අපි පිළිගන්නවා කරන අකුසල් විපාක ලබමින් අවුරුදු කෝටි ප්‍රකෝටි ගණන් දුක් විඳින වෙනම ස්ථාන තිබෙනවා කියලා. ඒවා තමයි අපාය කියන්නෙ. ආයුෂ තිබෙන නමුත් සැපය නෑ. සැපයෙන් තොර බැවින් අපාය කියලා හඳුන්වනවා. ඒවා තියෙනවා ඔක්කොම හතරක්. නරක, ප්‍රේත, තිරිසන් හා අසුර වශයෙන්. එයින් තිරිසන් අපායෙන් කොටසක් අපට පේන්න තියෙනවා. ප්‍රේත අපාය අපට පේන්නේ නැහැ අපි පින් ඇති අය නිසා. එතරම්ම ප්‍රේත අපාය දුක්ඛිතයි. තිරිසන් අපායෙත් අපිට නොපෙනෙන අය වැඩියි. අසුර අපායත් ප්‍රේත අපායෙම කොටසක්. ඊළඟට නරකාදියේ තියෙනවා කොටස් 136 ක්.

සංජීව, කාලසූත්‍ර, රෞරව, මහාරෞරව, සංඝාත, තාප, ප්‍රතාප, අවීචි යනුවෙන් මහා නරක අටක් තියෙනවා. ඒ මහා නරක අටේ හතර පැත්තේ හතර බැගින් එකක දහසයක් තියෙනවා. ඒවට කියන්නේ ඔසුපත් නරකවල් කියලා. ඔසුපත් නරක 128 ක් තියෙනවා. මහා නරක අට සමඟයි සියල්ලම 136 ක් වෙන්නේ. ඒවා මහා පෘථිවිය මැද්දේ එකින් එකට පහළින් පිහිටා තිබෙන්නේ. මේ මිහිතලයේ සිට යොදුන් සීයක් යට පිහිටා තිබෙනවා සංජීවය. ඒකෙ දිග පළල යොදුන් සීයයි. තව යොදුන් සීයයකට යටින් ඊළඟට කාලසූත්‍ර නරකය පිහිටා තියෙනවා.

මෙසේ යොදුන් සියය සියය යට මහා නරක අට පිහිටා තියෙනවා. ඒ හැම එකකම දිග පළල උස යොදුන් සියය බැගින් වෙනවා. දැන් ඉතින් ඒක අපට අමුතු දෙයක් නුහුරු දෙයක් නෙමෙයි. අපි සංසාරෙ යම්තාක් උප්පත්තිය ලැබුවා නම් වැඩිම වාර ඉපදිලා තියෙන්නේ නරකාදියේ. අට්ඨකථා දේශනාවක තියෙනව ''**පමත්තසසහ නාම චත්තාරො අපායා සකගෙහ සදිසා**'' කියලා. මේ පමා වූ පෘථග්ජන ජනතාවගේ ස්වකීය ගෙය සතර අපායයි යනු එහි අදහසයි. එතරම්ම කාලයක් අපි හිටියේ සතර අපායේ දැන් අපි භාවනා වඩලා දිවැස් නුවණත්, පෙර විසූ ආත්ම බැලීමේ නුවණත් ලැබුවොත් අපට මේව

බලන්න පුළුවන්. එතෙක් අප බුදුරජාණන් වහන්සේ කෙරෙහි විශ්වාසයෙන්, ගෞරවයෙන් ශ්‍රද්ධාවෙන් පිළිගන්නවා සතර අපාය තිබෙන බව.

**ප්‍රශ්නය: අපායෙ යම රජජුරුවො කියන්නේ මොන වගේ කෙනෙක් ද?**

පිළිතුර: යමදෙව් රජ්ජුරුවො කියන්නේ වේමානික අසුරයෙක්. වේමානික කියන එකේ තේරුම අඩමසක් දෙව් සැප අඩමසක් ප්‍රේත දුක. අට මහා නරකයේ දොරටු හතරක් තියෙනවනෙ, දොරටු හතරෙ හතර දෙනා බැගින් රජවරු තිස් දෙනෙක් ඉන්නවා. අඩමසක් අඩමසක් පාසා ඒ අය දෙව් සැප සහ ප්‍රේත දුක විඳිනවා. එම යම රජවරු තිස් දෙදෙන දෙව් සැප අවස්ථාවෙ තමා අපායෙ ඉන්නේ. අඩ මසකින් පසු ප්‍රේත දුක විඳින විට වෙනත් පිරිසක් එතැනට එකතු වෙනවා. ඒ යම රජවරු ද නැවත අඩමසකින් ප්‍රේත දුකින් මිදී දෙව් සැප විඳිනවා. ඔහොම යම රජවරු එක් කෙනෙක් නෙමෙයි හැට හතර දෙනෙක් ඉන්නවා.

**ප්‍රශ්නය: යම රජවරු වෙන්නෙ ප්‍රේත කොට්ඨාශයක් නම් ඒ අය කොහොමද අනිත් අයට දඬුවම් නියම කරන්නෙ?**

පිළිතුර: ඒ අය දඬුවම් නියම කරනවා නෙමෙයි. ඒ ඇත්තො ධාර්මික සේවයක් කරන්නේ. මොකක් ද? ධාර්මික සේවය. බලවත් පව්කම් කර මරණින් මතු කෙළින්ම අටමහා නරකයට යන අයට නඩු ඇසීමක් නෑ. ඒ හැර ඔසුපත් නරකවල උපන්නහම යමපල්ලො ඒ පුද්ගලයව යම රජු ළඟට එක්ක යනවා. යමපල්ලො කියන්නේ යම ලෝකෙ දුක් විඳින සත්ත්වයොමයි. එහෙම එක්ක යන්නෙ යම රජතුමාගෙ විධානයක් තියෙනවා කවුරුහරි ඇවිත් අපායෙ උපන්නම මට මුණගස්සන්න කියලා. ඒ සම්මුඛ කිරීමෙන් පස්සෙ ප්‍රශ්න පහක් අහනවා. දේව දූතයො පස් දෙනෙක් පිළිබඳවයි ප්‍රශ්න කරන්නෙ. පින්වත ඔබ මනුස්ස ලෝකේ කුඩා දරුවෙක් දැකලා නැද්ද? කථා කරන්න බැරිව තමාගේම මලමූත්‍ර ගොඩේ ඉන්න කුඩා දරුවෙක් වගේ මමත් සිටියා. තවත් මට එසේ ඉන්න සිදුවෙනවා. මම මේ දුකින් මිදීමට පින් දහම් වල යෙදෙන්න

ඕන කියලා ඔබට හිතුනේ නැද්ද? මෙසේ ප්‍රශ්න කිරීමේ දී ඒ පුද්ගලයාට සිහිවුනා නම් තමා කළ යම්කිසි කුසලයක් ඒක නැවත නැවත ආවර්ජනා කරන්න කියනවා. එතකොට අපායෙන් නිදහස් වී සුගතියට යනවා. එහෙම නැත්නම් ජරාජීර්ණ වූ පුද්ගලයෙක් ගැන අහනවා. ඔබ මහළු කෙනෙක් දැකලා නැද්ද? පිළිතුරු දෙනවා දැක්කා කියලා. දැක්කා නම් මමත් මෙසේ මහළු බවට පත් වෙනවා. ඊට කලින් අප්‍රමාදව කුසල් දහම් දියුණු කරන්න ඕන කියලා ඔබට හිතුනේ නැද්ද? මෙසේම ලෙඩෙක් දුටුවා ද? රාජ දඬුවම් ලද පුද්ගලයෙක් දුටුවා ද? මරණයට පත්වූ පුද්ගලයන් දුටුවා ද? යනාදී වශයෙන් මේ කරුණු පහ එකක් ගානේ විමසනවා. එසේ ප්‍රශ්න කිරීමේ බලාපොරොත්තුව දඬුවම් නියම කිරීම නෙමෙයි. මෙසේ ප්‍රශ්න කිරීමේ දී යම් අමතක වූ කුසලයක් තිබුනොත් එය මතක් වෙනවා. ඒ මතක් වීම නිසා අපායෙන් මිදී සුගතියට එනවා. ඒනිසා යම රජතුමා කරන්නේ ධාර්මික සේවයක්.

එක තැනක සඳහන් වෙනවා එක්තරා පුද්ගලයෙක් අපායේ ඉපදිලා යමරජු වෙත ගෙනාවම ඔය මුලින් කී දේවදූතයො පස්දෙනා පිළිබඳව විමසුවා. නමුත් ඔහුට පිනක් මතුවුනේම නැහැ. නමුත් ඒ පුද්ගලයා මනුස්ස ලෝකෙ සිටිය කාලෙ චෛත්‍යයකට කොඩියක් පූජා කරලා යම රජ්ජුරුවන්ටත් පින් දීලා තිබුණා. ඒක යම දෙව් රජ්ජුරුවේ දන්නවා. ඉන්පසු එතුමා කියනවා ඔබ අහවල් දවසෙ  අහවල් තැනදි චෛත්‍යයට කොඩියක් පූජා කරලා මටත් පින් දුන්න මතක නැද්ද? ඉන්පසු ඔහුට එම පින මතක් වුනා. ඒක නැවත නැවත සිහි කරන්න කියා යම රජතුමා උපදෙස් දුන්නා. එය සිහිපත් කරන විට ඔහු අපා දුකෙන් මිදි දෙව් ලොව ඉපදුනා. මේ විදියට අපා දුකෙන් නිදහස් වීමට කෙනෙකුට උපකාර කිරීමක් යම රජ්ජුරුයො කරන්නේ එහෙම නැතිව කාටවත් දඬුවම් දීමක් නෙමෙයි.

**ප්‍රශ්නය: ඔය කියන කරුණු පහ හෙවත් දේවදූතයො පිළිබඳ විමසීමේ දී ඔහුට කුසලයක් මතුකරගන්න බැරිවුනා නම් වෙනත් කුසලයක්ද සිහියට ආවේ නැතිනම් ඊට පස්සේ මොකද වෙන්නේ?**

**පිළිතුර:** දැන් මේ කරුණු පහෙන්ම මේ පුද්ගලයාට පිනක් මතුකරගන්න බැරිවුනා නම් එවිට යම රජ්ජුරුවො කියනවා පින්වත මේ කර්මය ඔබේ මව් පිය දෙදෙනා කළදෙයක් නෙමෙයි. සහෝදර සහෝදරියන් සහ ලේ නෑදෑයින් හිතමිතුරන් කළදෙයක් නෙමෙයි. නුඹම කළ දෙයක් මෙහි විපාකය නුඹම විඳිය යුතුයි කියලා කියනවා. මිසක් අසවල් අසවල් වද දෙන්න කියලා නියම කිරීමකුත් නැහැ. ඒ යමපල්ලන්ට වද දෙන්න හිතෙන්නේ එක එක ආකාරවලට ඔහුගේ කර්මය අනුවයි. පෙර ආත්මේ කරගත් අකුසල කර්මවල ආකාරයට විවිධාකාර දුක් විඳමින් සිටිනවා.

**ප්‍රශ්නය: යමපල්ලො කියන්නේ කවුද? ඒ අය අනිත් අයට දඬුවම් දෙන විට ඔවුන්ට පව් සිදුවෙන්නේ නැද්ද?**

**පිළිතුර:** යමපල්ලො කියන්නේ අපායේ දුක් විඳින සත්ව කොට්ඨාශයක්. ඒ අයත් අපායේ කාලයක් දුක් විඳිනවා. තවත් කාලයක් දඬුවම් දෙනවා. ඒ දඬුවම් කිරීම නිසා ඒ අයට අකුසල් රැස්වෙනවා. දැන් මනුස්සයෙක් තවත් මනුස්සයෙකුට දඬුවම් දෙන විට අකුසල් වෙනවා වගේ තමයි. බන්ධනාගාර වල අලුගෝසුවො කියලා වදයට නියම වූ අයට දඬුවම් දෙන අය සිටියනේ. ඒ අය නීතියෙන් එල්ලා මැරීමට නියම වූ පුද්ගලයන්ට දඬුවම් ලබා දීලා තමන් බොහෝ අකුසල කර්ම රැස්කරගන්නවා. ඒ වගේ තමයි අපායේ ඉන්න යමපල්ලෝ අනුන්ට වදදී තමන් පව් රැස්කරගන්නවා.

**ප්‍රශ්නය: අපායේ ආයුෂ ප්‍රමාණය කොපමණද?**

**පිළිතුර:** මනුෂ්‍ය ප්‍රමාණයෙන් අනූ ලක්ෂයක් අවුරුදු චාතුර්මහාරාජික දිව්‍ය ලෝකයට පරමායුෂ වෙනවා. එම අවුරුදු අනූ ලක්ෂය ''සංජීව''කියන මහා නරකයට එක දවසක්. අපායෙ වැඩිම ආයුෂ තිබෙන්නේ අවීචියට කල්පයක්ම එහි දුක් විඳින්න සිදුවෙනවා. මෙසේ දිව්‍ය ආයුෂ අනුවයි අපායේ ආයුකාලය දක්වලා තියෙන්නේ. දිව්‍යලෝක හය අතරෙන් වැඩිම ආයුෂ තියෙන්නේ පරනිම්මිත වසවර්ති දිව්‍ය ලෝකයේ. මිනිස් වර්ෂ ප්‍රමාණයෙන් අවුරුදු නවසිය විසිඑක්කෝටි හැටලක්ෂයක්. එපමණ දීර්ඝ

කාලය තාප නම් අපායට එක් දවසක්. මෙසේ අති දීර්ඝ කාලයක් දුක් විඳින ස්ථානයක් නරකාදිය කියන්නේ.

**ප්‍රශ්නය: නිතර ආමිස ප්‍රතිපත්තති පූජා සිදුකරන ශ්‍රද්ධාවන්ත බෞද්ධයෝ පවා අපාය විශ්වාස නොකරන්නේ අපාය අපේ පියවි දෑසට නොපෙනෙන නිසා. එය නොපිළිගත යුතු බව ඇතැම් දේශකයො ජනමාධ්‍ය තුළින් පවා ප්‍රකාශ කරන නිසා. ඒ මිත්‍යා මතය පතුරුවා හරින අය ප්‍රසිද්ධියේම කියනවා යමක් පොතේ තිබූ පමණින් පිළිගන්න බැහැ කියලා. මේ මතය පිළිබඳ ඔබ වහන්සේගේ අදහස?**

පිළිතුරු: ඒක හරි පුදුම කීමක්. එසේ නම් අපට අපාය පිළිබඳ බුද්ධ දේශනා පමණක් නෙමෙයි මුළු ත්‍රිපිටක ධර්මයම ප්‍රතික්ෂේප කරන්න සිදුවෙනවා. මහරහතන් වහන්සේලා වාචෝද්ගතව පරම්පරා වශයෙන් මහත් ගෞරවයෙන් ආරක්ෂා කරගෙන ආ බුද්ධ දේශනාව මාතලේ අළුලෙනේ දී ග්‍රන්ථාරූඪ කළේ බොහෝ කලක් ධර්මය නොනැසී පැවතීම සඳහායි. එසේ පොත් පත්වලට නඟන ලද ධර්මය පිළිගන්න බැහැයි කියා යමෙක් කියනවා නම් එය මෝඩ කමක්. අපට නොපෙනෙන දේවල් ලෝකයේ කොච්චර තියෙනවා ද? නිවන අප විශ්වාස කරන්නේ අපි හැමෝම නිවන් දැකලා නෙමෙයිනෙ. අපේ බුදුරජාණන් වහන්සේ එය අවබෝධ කරගෙන අපට දේශනා කළ නිසානෙ. බුද්ධ දේශනාවේ තියෙනවා සිද්ධියක් බුදුරජාණන් වහන්සේ ළඟට පැමිණියා මිත්‍රයෝ දෙන්නෙක් එක් අයෙක් බුද්ධාගම පිළිගන්නවා. අනික් කෙනා පිළිගන්නේ නැහැ. එක් අයෙක් නොපිළිගන්නේ එයාගේ දෘෂ්ඨිය වෙනස්. චතුරාර්ය සත්‍යය, ධ්‍යාන අභිඥා, විදර්ශනා මාර්ගඵල පිළිබඳ ඔහුගේ පිළිගැනීමක් නැහැ.

බුදුරජාණන් වහන්සේ මේ දෙන්නට හොඳ නිදර්ශනයක් වදාළා. යාළුවො දෙන්නෙක් යනවා ඇවිදගෙන. යනවිට බොහොම ලස්සන කඳු මුදුනක් තියෙනවා. ඒ කන්දට හැමෝටම නගින්නත් බැහැ. එක්කෙනෙක් බොහොම දක්ෂයි. එයා නැග්ගා ඒ කඳු මුදුනට. බිම ඉන්න කෙනා අහනවා මොනවද පේන්නේ කියලා. එවිට පිළිතුරු දෙනවා

මට පේනවා හරි ලස්සන ආරාම, පොකුණු, මාළිගා ආදී චමත්කාරජනක දර්ශන පේනවා කීවම බිම සිටින කෙනා කියන්නේ ඕව බොරු, මට ඕව පිළිගන්න බැහැ කියලා. ඉතිං අර උඩ ඉන්න කෙනා කියන දේ පහළ ඉන්න එක්කෙනා බාර ගන්නේ නැහැ. මොකද හේතුව එයාට ඒ කිසිවක් නොපෙනෙ නිසා. පස්සේ උඩ ඉන්න එක්කෙනා බැහැලා කොහොම හරි මේ පුද්ගලයා එක්කගෙන යනවා කඳුමුදුනට. ගියාම පෙන්නුවා බලන්න මම කිව්වේ ඇත්ත ද බොරු ද කියලා. ආන්න එවිටයි එයා පිළිගත්තේ.

ඒ වගේ මේ කාලේ බොහෝ මනුස්සයෝ බුද්ධාගමේ තියෙන ඇතැම් කරුණු සත්‍ය වශයෙන් පිළිගන්න අකමැතියි. ඒ මොකද ඒ ඇත්තන්ට මේක අවබෝධ කරගන්න තරම් නුවණ මෙහෙයවන්න බැහැ. කූපමණ්ඩූක උපමාව එබඳු ඇත්තන් විසින් සලකා බැලීම වටිනවා. ඒ නිසා මේව නොපිළිගන්නා උදවිය පිළිබඳ අපට අමුතුවෙන් මහන්සිගන්න අවශ්‍ය නෑ. ඒ ඇත්තන්ට නුවණ ලැබේවා කියා අපි මෛත්‍රී කරමු.

**ප්‍රශ්නය: අපායට දෙව්ලොවට යන සත්ත්වයො දැකගන්නා බුදුරජාණන් වහන්සේගේ දිවැස් නුවණ පිළිබඳව ස්වාමීන්වහන්ස පැහැදිළි කිරීමක් කළොත්?**

පිළිතුර: **ඍද්ධිවිධ ඤාණය**

**දිව්‍යශ්‍රෝත ඤාණය**

**පරචිත්තවිජානන ඤාණය**

**පූර්වේනිවාසානුස්සති ඤාණය**

**දිබ්බචක්ඛු ඤාණය**

මේ පහට කියනවා **පඤ්ච අභිඥා** කියලා. එයින් එකක් තමයි මේ දිබ්බචක්ඛු ඤාණය. දෙවියන්ටත් බ්‍රහ්මයන්ටත් ඕනතරම් ඈත තියෙන දෙයක් ළඟ තියෙන දෙයක් වාගේ දකින්න පුළුවන් ප්‍රසන්න ඇස් තියෙනවා. ඒ දෙවියන්ගේ බ්‍රහ්මයන්ගේ ඇස් අපේ වගේ කෙස් ලොම්

ආදී කුණප කොට්ඨාශ වලින් හැදුන ඇස් නෙමෙයි. ඇස් බොහොම ප්‍රසන්නයි. වාත පිත සෙම ආදියෙන් පලිබෝධයක් නැහැ. ඒ ඇත්තන්ට ඇස් රෝගයක් නැහැ. බොහොම සියුම් දේවල් දකින්න පුළුවන්. ගස් ගල් පර්වත විනිවිද දකින්න පුළුවන්. ඒවා කර්ම විපාකයෙන් හටගත් ඇස්. යොදුනක් තරම් දුරට පෙනෙන එවන් ප්‍රසන්න නේත්‍ර යුගලක් අපේ සර්වඥයන් වහන්සේටත් තිබුණ බව අහල ඇති. ඇස් දන්දුන් පසුව සිවි මහරජතුමාට ලැබුණ ඇස් දෙක යොදුන් සියයක් දුර පෙනුන බව දැක්වෙනවා. සියල්ල විනිවිද දකින්න පුළුවන්. ඒකට කියනවා ප්‍රසාද චක්ෂු කියලා. සසර ඇස් දන්දීම නිසා සහ අනුන් දෙස මෛත්‍රී සහගත දෑසින් බලා දන්දීමෙන් අපේ බුදුරජාණන් වහන්සේට ඉතා ප්‍රසන්න නේත්‍ර යුග්මයක් ලැබුණා. ඒ ප්‍රසාද නේත්‍ර ඇති අය අතරත් සර්වඥයන් වහන්සේට තියෙනවා දිබ්බචක්ඛු කියලා ඥාණයක් බ්‍රහ්මයන්ගේ ඇස හා සමානව දකින්න පුළුවන් අභිඥාවක්. මේ දිබ්බචක්ඛුඥාණයේ තවත් අවස්ථා කීපයක් තියෙනවා. යථාකම්මූපග ඥාණය කියන එකත් දිබ්බචක්ඛුවේ ම අවස්ථාවක්. අනාගතංස ඥාණය කියන්නෙත් දිබ්බචක්ඛුවේම අවස්ථාවක්.

මේ දිබ්බචක්ඛුව ලැබෙන්න විශාල වැඩ කොටසක් තියෙනවා. බුද්ධ ශාසනයෙ තියෙනවා දසකසින කියලා භාවනා දහයක්. මේ දස කසිනයෙන් වඩන්න ඕන රූපාවචර ධ්‍යාන. ඊළඟට ආකාස කසිනය හැර ඉතිරි නවයෙන් අරූප ධ්‍යාන වඩන්න තියෙනවා. එවිට අෂ්ඨසමාපත්තිලාභී. මේ අෂ්ඨසමාපත්තිලාභී තැනැත්තා ඒ සමාපත්ති සියල්ල වශී බවට පමුණුවා ගෙන එයින් නො නැවතී අභිඥා ලැබීම සඳහා තියනවා වැඩකටයුතු රාශියක්. ඒ කියන්නේ දාහතර ආකාරයකින් කසින අටක් ම ප්‍රගුණ කරන්න තියෙනවා. ඒකට කියනවා ''**චුද්දසාකාර චිත්තපරිදමනය**'' කියලා. ඒ මක්නිසාද මේ දාහතර ආකාරකයට සිත වශීතාවයට පමුණුවන්නේ තත්පරයෙන් තත්පරයට කසිනයෙන් කසිනයට ධ්‍යානයෙන් ධ්‍යානයට මාරුවෙන්න තරම් සීඝ්‍රව සමවදින්න නැගිටින්න සමත් බවක් ඇතිකරගනු පිණිසයි. ඒ කියන්නේ එක එක

දේ නිර්මාණය කරන්න එක එක දේ සඳහා නුවණ මෙහෙයවන්නට ඒ කසින එක එක ජාතියකින් පමණයි පුළුවන් වෙන්නේ. ඒනිසා තමයි ක්ෂණිකව ඒ කසිනයන්ට ඒ ඒ ධ්‍යානයන්ට සමවදින්න ප්‍රගුණ කරගන්න ඕන. ඒසේ ප්‍රගුණ කරගත්තම ලැබෙන ඛිප්ප නිසන්තිතාව කියන අවස්ථාවේ ක්ෂණිකව අභිඥාව ප්‍රයෝජනයට ගන්න පුළුවන්. ඊළඟට දිබ්බචක්ඛු අභිඥාවෙන් ළඟ තියෙන දුර තියෙන දේ දකින්න කැමති නම් ඒකට තියෙනවා කසින ධ්‍යාන තුනක්, ආලෝක කසින, තේජෝ කසින, ඕදාත කසින කියලා. ඔය කසින එකකින් රූපාවචර චතුර්ත ධ්‍යානයට සමවදින්න ඕන. සමවැදිලා ඒකේ ආලෝකය උඩ යට සරස අනන්ත ලෝක ධාතුවට විහිදුවන්න ඕන. ඊළඟට ආයෙමත් ඒ මැද්දේ හිත තියාගෙන ධ්‍යාන සතරට සමවදින්න ඕන. එහි ධ්‍යානාංග බලා ආයෙමත් ධ්‍යානයෙන් අවදිවෙලා අධිෂ්ඨාන කරන්නට ඕන මට අසවල් දේ පෙනේවා කියලා. ඒ පෙනේන දේ මෙපමණ වේලාවක් පෙනේවා කියලත් අධිෂ්ඨානය කරන්නට ඕන. එසේ අධිෂ්ඨාන කරලා නැවත රූපාවචර චතුර්ධ්‍යානයට සමවදින විට එක චිත්තක්ෂණයකින් ඒ අවශ්‍ය දේ හරියටම විනිවිද දකින්නට පුළුවන් නුවණ පහළ වෙනවා. ඉන් පස්සේ උපචාර සමාධි සිතින් ඒක දකිනවා.

මේක බොහොම තීක්ෂණව කළ යුතු දෙයක්. ඒක අපේ සර්වඥයන් වහන්සේට තරම් වෙන කාටවත් නැහැ. අන් අයට සමීප කිරීමට බැරි අසමාන්‍ය ශක්ති විශේෂයක් බුදුරජාණන් වහන්සේගේ අභිඥා බලයේ තියෙනවා. එයින් මේ දිබ්බචක්ඛු ඥානයෙන් අරවාගෙ කුසල් කරන සුගති දුගති යන සත්ත්වයන් චුතවෙන උපදින සත්ත්වයන් ඒ වගේම ශෝභන අශෝභන සත්ත්වයන් දකිනවා. ඊළඟට යථාකම්මූපග ඥානය. ඊට සම්බන්ධ බැවින් මේ සත්ත්වයෝ කයින් වචනයෙන් සිතින් පින්කළා. ආර්යයන් වහන්සේලාට ගෞරව කළා. ආර්ය මාර්ගය අනුගමනය කළා. සම්මාදිට්ඨියේ පිහිටා සිටියා, බොහෝ කුසල් රැස් කළා. දන් දුන්නා. සිල් රැක්කා. සමථ විදර්ශනා භාවනා වැඩුවා, මෙබඳු සත්ත්වයො චාතුර්මහාරාජිකයෙ තාවතිංසයෙ උපන්නා. ධ්‍යානලාභී අයෙකු නම්

බඹලොව උපන්නා, සංඥා විරාග භාවනා වඩලා අසඤ්ඤ තලයේ උපන්නා. පින් කළ නිසා සුගතියේ උපන්නා. කියලා පරලොව උපදින සත්ත්වයෝ සර්වඥයන් වහන්සේ දකිනවා. කයින් සිතින් වචනයෙන් බොහෝ නානාප්‍රකාර අකුසල් නිසා ප්‍රේත අපායේ, තිරිසන් අපායේ, අසුර අපායේ, නරකාදියේ උපදින සත්ත්වයො දකින්නෙත් මේ ආකාරයටමයි.

**ප්‍රශ්නය:** **බුදුරජාණන් වහන්සේ දිවැස් නුවණින් සුගතියට යන සත්ත්වයන් දැක ගන්නා අයුරු බොහෝ සූත්‍ර දේශනාවල අප අසා තිබෙනවා. එතැන සඳහන් වෙන විසුද්ධෙන අතික්කන්තේන මානුසකේන සත්තේ පජානාති යන කරුණ පැහැදිළි කළොත්?**

**පිළිතුර:** විසුද්ධෙන කියන්නේ නීවරණයන්ගෙන් තොර වූ චතුර්ථ ධ්‍යානයට කියන නමක් අතික්කන්ත මානුසකේන කියන්නේ මිනිස් ඇසට නොපෙනේන සමාන්‍ය පියවි ඇස ඉක්මවා සිටින කියන තේරුමයි. මිනිස් ඇස ඉක්මවා සිටි අවබෝධය දිබ්බචක්ඛු ඥානයයි. බුදුරාජාණන් වහන්සේ මෙලොවින් චුතවන පරලොව උපදින සුගතියට දුගතියට යන කර්මානුරූපව ඒ ඒ තැන ප්‍රතිසන්ධිය ලබන සත්ත්වයන් දැකගන්න ආකාර කිහිපයක්ම තිබෙනවා. එකක් සර්වඥතා ඥානයෙන් ආවර්ජනා කළ මාත්‍රයෙන් දකිනවා. දෙවන ක්‍රමය දිබ්බචක්ඛු ඥානයෙන් දැකීම. බුදුරජාණන් වහන්සේ තේජෝ කසිනයෙන් ආලෝක කසිනයෙන් හෝ ඕදාත කසිනයෙන් චතුර්ථ ධ්‍යානයට සමවදිනවා. සමවැදී එයින් නැගිට ධ්‍යානාංග බලනවා. ඒ ධ්‍යානයෙන් නැගිටිලා ආවර්ජනා කරනවා, මම අසවල් පුද්ගලයා දකින්න ඕන කියලා. අපාය දකින්නෙත් මේ චතුර්ථ ධ්‍යාන සමාධි සිත නිසා.

දිව්‍ය ලෝක පිළිබඳවත් එහෙම තමයි. මනුලොව තමයි දෙව්ලොව යන කුසල් තියෙන්නෙ. දෙව්ලොව ඉපදීමට සුදුසු කුසල් කළාම මරණාසන්න අවස්ථාවේ එම කුසල් සිහිවී දෙව්ලොව යනවා. දිව්‍යලෝක හයක් තියෙනවා. චාතුර්මහාරාජික, තාවතිංස, යාම, තුසිත, නිම්මාණරති, පරනිම්මිත වසවර්ති, වශයෙන් එම දිව්‍යලෝක හඳුන්වනු ලබන්නේ.

මනුලොව සිට යොදුන් හතලිස් දෙදාහක් දුරින් පළමුවෙනි "චාතුර්මහාරාජික" දිව්‍යලෝකය පිහිටා තිබෙනවා. එය යොදුන් දසදහසක් දිග පළලින් යුක්තයි. එයට යොදුන් හතලිස් දෙදාහක් ඉහළින් තව්තිසා දිව්‍යලෝකය පිහිටා තිබෙනවා. ඉහළට යන්න යන්න ආයුෂ, වර්ණ, සැප, බල, ප්‍රඥා සම්පත් වැඩියි. අපේ මනුලොව අවුරුදු පනහක් චාතුර්මහාරාජික දෙව්ලොවට එක දවසයි. අපේ අවුරුදු වලින් අනූලක්ෂයක් අවුරුදු එහෙට ආයුෂ තියෙනවා. ඉහළට යන්න යන්න සතර ගුණයෙන් ආයුෂ වැඩිවෙනවා. ඉහළම දෙව්ලොව සිට යොදුන් පනස්පන්ලක්ෂයකඅටදාහකට ඉහළින් පළමු බ්‍රහ්ම තලය පිහිටා තියෙන්නේ. ප්‍රථම ධ්‍යාන තලය. එතැන් සිට තව පනස්පන්ලක්ෂ අටදාහකට ඉහළින් දෙවැනි බ්‍රහ්ම තලය පිහිටා තියෙනවා. ඔහොම යොදුන් පනස්පන්ලක්ෂ අටදාහ බැගින් ඉහළින් සියලුම බ්‍රහ්ම ලෝක පිහිටා තියෙනවා. භවාග්‍රය දක්වාම.

දැන් භවාග්‍රයේ සිට (ඉහළම බඹලොව) යොදුනක් උස පළළ ඇති ගල් පර්වතයක් පහළට එව්වොත් විනාඩියකට යොදුන් දහතුනකුත් තුනෙන් එකක් පාත් වෙනවා. පැයකට යොදුන් අටදාහක් පාත් වෙනවා. එය පොළොවට පාත් වෙනවා. එය පොළොවට පාත් වෙන්න අවුරුදු හතරකුත් මාසයකුත් දින 27ක් ගත වෙනවා. එච්චර දුර තියෙනවා මනුලොව සිට බඹලොවට. නමුත් යමෙක් බඹලොවින් චුතවෙලා මනුලොව උපදින්න ඉන්නවා නම් එහෙන් චුත වීමත් සමගමයි අතරක් නැර මනුලොව උපදින්නෙ. තත්පරයක් වත් පමාවෙන්නෙ නෑ. චිත්තක්ෂණයක් පමණයි ගතවෙන්නෙ. මේවා අපේ බුදුරජාණන් වහන්සේ දෙසූ බුද්ධ වචනය අනුවම අපි තේරුම් ගන්නට ඕනෑ. අපි විශ්වාස කරනවා දෙව්ලොව හයක් තිබෙන බව, රූපාවචර බ්‍රහ්ම ලෝක දහසක් තිබෙන බව, අරූපාවචර බ්‍රහ්ම ලෝක හතරක් තිබෙන බව, අවීචියේ පටන් භවාග්‍රය දක්වා භූමි තිස් එකක් තිබෙන බව අප පිළිගන්නවා. කාමභව එකොළහයි, රූප භව දහසයයි, අරූප භව හතරයි, සංඥා භව විසි නවයයි, අසඤ්ඤ භව එකයි, නේවසඤ්ඤානාසඤ්ඤා භව එකයි,

ඒකවෝකාර භව එකයි, චතුවෝකාර භව හතරයි, පඤ්චවෝකාර භව විසිහයයි. මෙන්න මෙහෙම නව මහා භවයක් බුදුරජාණන් වහන්සේ දේශනා කරලා තියෙනවා. මේවා තමන්ටම බලාගන්න පුළුවන් ශීලයක පිහිටා සමථ භාවනා වඩා අට්ඨ සමාපත්ති උපදවා චුද්දස ආකාරයට සිත දමනය කරගෙන අභිඥාබල පහ ඉපදෙව්වා නම්. එවිට සිය නුවණින් මේවා දකින්න පුළුවන්. සිය කයින් මේ තැන්වලට ගිහිල්ලා කතා බහ කරලා එන්නත් පුළුවන්. අපි නොබියව ප්‍රකාශ කරනවා බෞද්ධ මහජනයාට මේවා සර්වඥයන් වන්සේ දෙසූ බැවින් අපි පිළිගන්නා බවත් අපට යම්කිසි දවසක සමථ විදර්ශනා වඩල අභිඥාබල උපදවා ගත්තොත් මේ ජීවිතයේදී ම සර්වඥයන් වහන්සේ ගේ දේශනාව අනුව මේවා දැකගන්න හැකිවෙන බවත් සියල්ලෝම ඒ සඳහා උත්සාහ වෙත්වා කියා අපි ආරාධනා කරනවා.

**ප්‍රශ්නය: අපි අතින් අතපසුවීමකින් යම් පාපයක් සිදුවුනා නම් එය නැවත නැවත සිහිවීමේදී අපට ඇතිවෙන පසුතැවිල්ල නැතිකරගන්නේ කොහොම ද?**

**පිළිතුර:** බොහෝ සෙයින් මිනිසුන් අතර ඉන්නවා නොදන්නා කමෙන් පව්කම් කරගෙන පසුව පසුතැවෙන අය. ඒ අය බයෙන් තැතිගන්නවා මේ අපාය පිළිබඳ දේශනා දැනගෙන. එහෙම අවස්ථාවල අප හිතන්න ඕන මෙහෙම. ලෑල්ලකට ඇණයක් ගැසුවාම ඒක වැරදුනා නම් අනිත් පැත්තෙන් ඇණයක් ගහලා ඒක ගලවනවනෙ. ඒ වගේ අපේ සිතට දරන්නට බැරි පසු තැවෙනසුළු අකුසලයක් සිදුවුනා නම් ඒක නැවත නැවත සිතා පසුතැවෙන්නේ නැතිව හිත හදාගන්න යෝනිසෝමනසිකාරය හුරුකිරීම වැදගත් වෙනවා. අපි හිතමු කෙනෙක් අතින් සතෙක් මැරුණා කියලා. ඒ ගැන පසුතැවී සිටියා නම් අපාගාමී වීමට පුළුවන්. සතා මැරෙන අවස්ථාවේ අපේ සිතේ යම් චිත්ත චෛතසික ධර්ම පහළ වුනා අකුසල චිත්ත පරම්පරාව. ඒව දැන් නැහැ. ඒව ඒ වෙලාවෙම ඇතිවී නැතිවී ගියා. ඒ සතා මරණ අවස්ථාවෙ මගෙ සිතේ පහළ වූ චිත්ත චෛතසික ධර්ම රූප ධර්ම ඇතිව නැතිව ගියා අනිත්‍යයි

දුක්ඛයි අනත්තයි කියා ත්‍රිලක්ෂණයට හරවනවා. ඒ වගේම මරණයට පත්වූ සතා පෙර ජාතිවල මගේ මව, මගේ පියා, මගේ දුව, පුතා, සහෝදරයා වී සිටින්නට ඇති අනන්ත ජාතිවල, මතුවටත් මුණ ගැසෙන්න පුළුවන්. ඒ සත්ත්වයා උපනුපන් තැන නිදුක් වේවා, නිරෝගී වේවා, සුවපත් වේවා, මගෙන් සිදුවූ වරදට සමාව ලැබේවා, ආදි වශයෙන් මෙත් සිත් පවත්වන්නට පුළුවන්. එයිනුත් විශේෂත්වය ලැබෙනවා මේ ත්‍රිලක්ෂණ විපස්සනාවට. ඊළඟට සිතනවා දැන් මේ සිතන පසුතැවෙන සිතත් අනිත්‍යයි දුක්ඛයි, අනත්තයි, අශුභයි කියලා. ත්‍රිලක්ෂණයට හරවනවා. මේ විදියට තමාගෙන් සිදුවුනා වූ කුඩා හෝ ලොකු හෝ අකුසලයක් සිහිවෙලා පසුතැවෙන්නෙ නැතිව ඒක විපස්සනාවට හරවලා නුවණට හුරුව කල්පනාකිරීමට සෑම විටම උත්සාහ වන්නට ඕන. ඒ අතරම ප්‍රයෝග සම්පත්තිය හෙවත් නිතරම තිදොරින් කුසල් රැස් කරන්නට අධිෂ්ඨාන කරගැනීම ඉතා වැදගත් වෙනවා.

**ප්‍රශ්නය: දෙව්ලොව බඹලොව ඉපදීමට හේතු වන කුසල් දහම් තිබෙන්නා සේ ඒ ඒ අපා භූමිවල ඉපදීමට මොනවගේ අකුසල් බලපානවද කියා පහදා දුන්නොත්?**

**පිළිතුර:** දේවදූත සූත්‍රයේ දී වගේම බොහෝ දේශනා වල දැක්වෙනවා ''**කාය දුච්ඡරිතේවා වචී දුච්ඡරිතේවා මනෝ දුච්ඡරිතේවා**'' කියා අකුසල් පැවතුම් තුනක් පිළිබඳව. සියලුම අකුසල් මෙයට ඇතුළත් වෙනවා. ඒ ඒ අකුසල් ශක්ති නිසා ඒ ඒ අපාභූමි වලට වැටෙන්නට සිදුවෙනවා. මරණාසන්න අවස්ථාවේ දරු මුණුබුරන් එසේත් නැතිනම් ගෙවල් දොරවල් වස්තුව මතක් වී ඒ ලෝභ සහගත සිතින් නම් මරණයට පත්වුනේ ඔහු බොහෝ සෙයින්ම වැටෙන්නේ ප්‍රේත අපායට. බොහෝ විට මෝහ සහගත අකුසල උත්සන්න නිසා වැටෙන්නේ තිරිසන් අපායට.

පඤ්ච ආනන්තර්ය කර්මය සහ නියත මිථ්‍යා දෘෂ්ඨිය කියන මේ බරපතල කර්කම හයක් තියෙනවා. මේ පව්කරගත්ත අය මනුලොවින් චුතවෙන කොට චුතියට අනතුරුව අවීචි මහා නරකයටම යනවා.

අවීචිමහනරකය කියන්නේ අතිශයින්ම අකුසල් උත්සන්න තැන. ගින්නෙන්වත්, දුකෙන්වත්, සත්ත්වයන්ගෙන්වත් අතරක් නැත කියන එකයි අවීචිය කියන්නේ. හැබැයි සත්ත්වයින් බොහෝ පිරී සිටියත් ඔවුනොවුන් පේන්නේ නැහැ. එක එක්කෙනා ගැටෙන්නේ නැහැ. මොකද භූත කොට්ඨාශවල තියෙනවා විනිවිද යන ස්වභාවයක්. එනිසා ඔවුනොවුන් පේන්නේ නැහැ. පඤ්ච ආනන්තර්ය කර්මය සහ නියත මිත්‍යදෘෂ්ඨිය ගත් අය මේ බිහිසුණු අවීචියේ දුක් විඳිනවා. දෙසැටක් මිත්‍යදෘෂ්ඨීන් අතරෙන් යමක් අල්වා ගත්තානම් අනිවාර්යයෙන් ඔහුට මේ අවීචි ආදී අටමහා නරකයේ දීර්ඝ කාලයක් දුක්විඳීමට සිදුවෙනවා. සක්වල විනාශවන කාලයේදීවත් ඔහුට ගොඩ එන්න බැහැ. අල්ලස් ගත්ත අය, බොරු සාක්ෂි දුන් අය, චුන්ද සූකරික වගේ ප්‍රාණඝාත කළ අය මෙවැනි අපමණ අකුසල් කළ අය පරදාරකර්මයේ යෙදුන අය මෙසේ බරපතල පාපකර්ම වලින් මුළු ජීවිතයම ගත කළ අය, කිසිම පිනක් දහමක් නොකළ අය, තමා අටමහා නරකයට කෙළින්ම යන්නේ, බඩුත් සමග සොරෙක් අසුවුනා නම් කෙළින්ම දඬුවම් ලැබෙනවා වගේ තමයි කෙළින්ම සංජීව, කාලසූත්‍ර, සංඝාත, රෞරව, මහා රෞරව, තාප, ප්‍රතාප, අවීචි යන අටමහා නරකයෙ ඉපදෙන බලවත් පව්කම් කළ අයයි.

ඇත්ත වශයෙන්ම දිව්‍යස් නුවණ පාවිච්චි කරන කෙනෙකුට මිසක් සාමාන්‍ය කෙනෙකුට මේක පිළිගන්න බැරි තරම් දෙයක්. විද්‍යාවට අනුව උනත් යම්කිසි මට්ටමකට නරකාදිය ඇතෙයි කියන මට්ටමට පිළිගැනීමක් ඇතිවෙලා තියෙනවා. දිග, පළල ආදිය පමණක් වෙනස්කම් තියෙනවා. ඒ අනුව සලකා බැලීමේ දී තිදොරින් සිදුකරගන්නා ලද බරපතල අකුසල නිසා අටමහා නරකයට කෙළින්ම යනවා. කුසල්, අකුසල් දෙකම කරගත් යමෙක් මරණාසන්න අවස්ථාවේ අකුසලයක් සිහිවීම නිසා ඔසුපත් නරකයක ඉපිද කර්මය ක්ෂය වනතුරු දුක් විඳිනවා. ජාතක පොතේ නිමි ජාතකයේ දැක්වෙන මොන මොන කර්මවලින් මොන මොන අපායවලට වැටෙනවා ද කියන කාරණය.

# දිව්‍ය ලෝකය

**ප්‍රශ්නය: ධර්මය නොදන්නා සමහර අය දෙව්ලොව පිළිබඳ විස්තර කිරීමේදී විමාන වස්තු ප්‍රකරණයේ සඳහන් වෙන දිව්‍යවිමාන සහ සමහර දෙවිවරු සිය ගණන් දහස් ගණන් දිව්‍ය පිරිස පිරිවරාගෙන සිටීම යනු සත්‍ය වශයෙන් පවතින දේවල් නොව තම මනසට අරමුණු වන දේවල් වශයෙන් පත්තරවලත් කියා තිබුණා. ඒ පිළිබඳව ද අප නාහිමිපාණන් වහන්සේගෙන් විමසූ පසු මෙසේ පිළිතුරු ලැබුණා.**

**පිළිතුර:** දිව්‍ය කියා හඳුන්වන්නේ සත්ත්ව පුද්ගල වශයෙන් හඳුන්වනු ලබන ආත්මභාව. දිව්‍යවිමාන කියන්නේ ඒ ඇත්තන්ගේ නැවතුම්පළවල්. සමහර විමාන අහසේ ගමන් කරන්න පුළුවන්. ඒ නිසා ඒවා සත්‍ය වශයෙන් තියෙන දේවල්. ඒ දෙවිවරු චුතවීමේ දී විමානය ද නිරුද්ධ වෙනවා. සුබ්‍රහ්ම කියන දිව්‍ය රාජයා දිව්‍යාංගනාවන් දහසක් පිරිවරාගෙන නන්දන වනයට ගියා. දිව්‍යාංගනාවෝ පන්සියයක් මල් නෙලනවා. අනිත් පන්සියය නෙලන මල් ගොතලා දිව්‍ය රාජයා සරසනවා. මේ අතර මල් නෙලමින් සිටිය පන්සියය නොපෙනී ගියා. දිවැසින් බැලුවා කොහෙද මේ ඇත්තො ගියේ කියලා. බැලුවාම පෙනුන චුතවෙලා ගිහින් අවීචියේ ඉපදිලා අකුසල කර්ම විපාකයක් නිසා. දිව්‍ය පිරිසක් තමා පිරිවරාගෙන සිටීම යනු මනසට අරමුණු වීමක් පමණක් නම් මේ පන්සියය අවීචියට යයි ද. ඊළඟට බැලුවම තේරුනා අනිත් පන්සියය දෙනා සමඟ තමන් ද අපාගත වෙන බව. පස්සේ බොහොම කණගාටුවෙන් බුදුරජාණන් වහන්සේ ළඟට ගියා. ගිහිල්ලා ප්‍රශ්නයක් විමසුවා ස්වාමිනි, අපේ සිත මෙහෙම චංචල වෙලා තියෙනවා. මේකෙන් අපට නිදහසක් නැද්ද කියා. එහිදි බුදුරජාණන් වහන්සේ දේශනා කළ ධර්මයට සිත යොමු කිරීමෙන් සෝවාන් වුනා. එයින් අපායට යන ගමන නැවතුනා. දිව්‍ය ලෝකය කියන්නේ, දිව්‍ය විමාන, දිව්‍ය පිරිවර

කියන්නේ සිතට අරමුණුවීම් මාත්‍රයක් පමණක් නම් අර අය අවීචියට යයි ද? අනිත් අය සෝවාන් වෙයි ද? ඕවා ඉතිං ධර්මය නොදන්නා අන්ධබාල පෘථග්ජන උදවියගේ ප්‍රලාප, මනස්ගාත. ශ්‍රද්ධාවන්ත බුද්ධිමත් ජනතාව බොහෝ සෙයින් සත්‍ය ධර්මයට රුචි කරන නිසා ඕවාට රැවටිය යුතු නැහැ.

**ප්‍රශ්නය: චාතුර්මහාරාජික තාවතිංස ආදී දෙව්ලොව හයක් පිළිබඳ ධර්මයේ සඳහන්වෙන බව අප අසා තිබෙනවා. මේවත් මනසට අරමුණු වන අවස්ථා බව සහ සත්‍ය වශයෙන් පවතින දේවල් නොවන බවත් ඇතැමුන්ගේ මතයක්. ඒ පිළිබඳවත් අනුකම්පාකොට පහදා දුන්නොත්?**

**පිළිතුර:** බුදුරජාණන් වහන්සේ විසාඛෝපෝසථ සූත්‍රයේ ඒ වගේම අභිධර්ම පිටකයේ විභංගප්‍රකරණයේ ධම්මපදය විභංග දේශනාවේ ඔය දිව්‍ය ලෝකවල පිහිටීම, දිව්‍යලෝකවලක ආයුෂ ප්‍රමාණය දිව්‍ය සම්පත් තිබෙන බව දේශනා කරල තියෙනවා. අරමුණු කිරීම් පමණක් නම් එහෙම ආයුෂ ප්‍රමාණ කොහොම ද කියන්නේ. දෙවියන්ගේ බ්‍රහ්මයන්ගේ ආයුෂ ප්‍රමාණය, සැපසම්පත් ගැන කියන්නට බැහැ. මේවා මනසින් අරමුණු කිරීම් පමණක් නම් බුදුරජාණන් වහන්සේ මේවා දේශනාකළේ අනුමාන බුද්ධියෙන් නොව ප්‍රත්‍යක්ෂ වශයෙන් අවබෝධ කරගෙනයි.

එහෙම සියල්ල ප්‍රත්‍යක්ෂ නුවණින් අවබෝධ කර දේශනා කළ දේ සත්‍ය වශයෙන් පවතින දේ නොව සිතින් අරමුණු කිරීම් පමණක් යැයි නැතහොත් ඒව ඔක්කොම තියෙන්නෙ සිතතුළ යැයි කියනවා නම් එය ධර්මය නොදන්නාකමෙන් ඇති කර ගත් අත්තනෝමතයක්. සත්‍ය දැකීමට නොහැකිව සිටින එබඳු උදවියට අප අනුකම්පා කළ යුතුයි.

# කය මිස සිත නැති බඹලොව

**ප්‍රශ්නය: සිත නැති බඹලොව පිළිබඳ අප අසා තිබෙනවා. අපේ ජීවිතය පවතින්නේ සිතත් කයත් නිසා මේ කියන බඹලොව බ්‍රහ්මයෝ සිතක් නැතිව පවතින්නේ කොහොමද?**

**පිළිතුර:** අබුද්ධොත්පාද කාලවල දිව්‍යැස් නුවණ පාවිච්චි කරන ධ්‍යාන ලාභී තාපසවරු දෙව්ලොව බඹලොව පිළිබඳ සොයලා බලන කොට අසඤ්ඤ තලය බොහොම දීර්ඝායුෂ බැවින් ඒ ඇත්තෝ හිතනවා ඒක සදාකාලික සුවයක් කියලා. ඒවගේම එම ධ්‍යාන ලාභී තාපසවරු කල්පනා කරනවා මේ දුක් සියල්ලම ඇති වෙන්නේ සිතටයි, ඒ නිසා සිත නිරුද්ධ කරලා සදාකාලික සුවයක් විඳින්න පුළුවන් අසඤ්ඤ තලයට ගිහින් කියලා. වායෝ කසින සමාපත්තිය වඩලා චතුර්ථ ධ්‍යානය උපදවලා එය වශී කරගෙන සංඥා විරාග භාවනාවක් වඩනවා. සිතට නිග්‍රහ කරමින් සිත නිරුද්ධ කරන්න අධිෂ්ඨාන කරනවා. මේ චතුර්ථ ධ්‍යානය කියන එක මහ බලගතු ධ්‍යානයක්. ඒකට කියන්නේ අධි චිත්තය කියලා. ඒ චතුර්ථ ධ්‍යානයට සමවැදිලා එයින් නැගිටලා සිත නිරුද්ධ කරන්න අධිෂ්ඨාන කරනවා. නැවත නැවත චතුර්ථ ධ්‍යානයට සමවදින්න ඒ අය සමර්ථ වෙනවා. අභිඥා බලයකින් යම් යම් දේ මවාපාන්න වගේ මේ සිත නිරුද්ධ කරලා ඒ අයට පැය ගණන් වරු ගණන් ඉන්න පුළුවන් වෙනවා.

**ප්‍රශ්නය: නාමරූප දෙකින් තොරව සත්ත්වයෙකු පවතින්නේ නැහැ කියා අපි අසා තියෙනවා. එසේ නම් නාමස්කන්ධය නොමැතිව රූපකාය පවතින අයුරු තව ටිකක් පැහැදිලි කරන ලෙස ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.**

**පිළිතුර:** කාමලෝකේ වගේ නෙවෙයි රූපලෝකයේ රූපස්කන්ධය ඇති වෙන්නෙ මෙහෙමයි. දැන් මනුලොව දී සංඥාවිරාග භාවනා කළ කෙනෙක් වාඩිවෙලා මරණයට පත්වුනා නම් අසඤ්ඤතලයෙ ඉපදෙන විට වාඩිවෙච්ච රූපයක් පහළ වෙනවා. ඒක ජීවිත නවක රූපයන්ගෙන් පිරුණු කර්ම සමුට්ඨාන රූපස්කන්ධයක් එතැන චිත්තජ රූප නැහැ. ඍතුජ රූප තියෙනවා. ආහාරජ රූප නැහැ. මනුලොවදී සැතපිලා නිරුද්ධ වුනා නම් එහිදී සැතපිච්ච රූපයක් පහළ වෙනවා. ඒ අය මනුස්ස ලෝකෙ පැය ගණන් සිත නිරුද්ධ කරල සිටියා වගේ චතුර්ථ ධ්‍යානයේ තියෙන ආනුභාවය නිසා කල්ප 500 ක් සිත නිරුද්ධ කරලා සිත නැතිව ජීවිත නවක රූප නවක රූප පරම්පරාව පමණක් කල්ප 500 ක් පවතිනවා.

යම් දවසක කල්ප 500 අවසාන වෙනවිට අර මුලින් නිරුද්ධ වුනා වූ චුති චිත්තයට අනතුරුව අනන්තර සමනන්තර අනන්තර උපනිශ්‍රය, නත්ථි විගත කියන ශක්ති විශේෂය ඇතිව කාම භවයෙහි ත්‍රි හේතුක උත්පත්තියකින් පටිසන්ධිය ලබනවා. ඒකයි පිළිවෙල. එතැන තියෙන්නේ නාම ධර්මයන් සියල්ලම නිරුද්ධ කරලා රූපකාය පමණක් පැවතීමේ අධිෂ්ඨාන බලය නිසා සිතෙන් තොර රූපකායක් පමණයි.

**ප්‍රශ්ණය: මෙහෙම සිත නිරුද්ධ කරලා එහෙ ඉපදෙනවානම් සිත නැතිව එතැන ඉපදෙන්නෙ කොහොමද?**

**පිළිතුර:** අසඤ්ඤ තලයෙ ඉපදෙන පුද්ගලයා සිත නිරුද්ධ කරන්නේ එහෙ ඉපදීමට පෙර මේ මනුලොවදීමයි. ඒ නිරුද්ධ කිරීමේ ශක්ති විශේෂය තමයි එතැන එල දුන්නේ රූපය පමණක් සිත නැතිව එක කර්මයක ඵලයක්.

**ප්‍රශ්නය: එතැන ප්‍රතිසන්ධි පිහිටන්නේ කොහොමද?**

**පිළිතුර:** ප්‍රතිසන්ධි සිතක් ඇත්තෙම නැහැ. ප්‍රතිසන්ධි සිත භවාංග සිත චුති සිත මේ කිසිවක් එතැන නැහැ. මේ මනුස්ස ලෝකේ චුතියයි. ඊළඟ කල්ප 500 කින් පසු නැවත මේ කාම භවයෙ පටිසන්ධියයි

පිහිටන්නෙ. ඒ අතරතුර සිතක් නැතිව කල්ප 500 ක් පවතින්නේ ධ්‍යාන සිතේ පවතින ශක්තිය නිසා.

**ප්‍රශ්නය: අසඤ්ඤ තලයෙ බ්‍රහ්මයෙක් ඒ බඹලොවින් චුතවෙන්නේ කොහොමද?**

පිළිතුර: චුතවෙන්නේ එයාට ගති නිමිති පහළවීමක් නැහැ බඹලොව යැමට හේතු වූ ධ්‍යානය වඩනවිට ඊට මුලින් ඇති වුන උපචාර කුසල්වල ශක්තිය තමයි ඊළඟ කල්ප 500 කින් පස්සේ කාම සුගති භවයක පටිසන්ධි ලබන්නේ. ඒ හැරුණු විට කර්ම. කර්ම නිමිති ගති නිමිති පහළවීමක් නැහැ.

# සිත මිස කය නැති බඹලොව

**ප්‍රශ්නය: අවසර ස්වාමීන් වහන්ස, බඹලොව කය නැති බ්‍රහ්මයින් පිරිසක් සිටින වග අප ඉගෙනගෙන තිබෙන නමුත් අරූපී බ්‍රහ්මයන්ට සියුම් කයක් පවතින බව පුවත් පතක කියා තිබුණා. අරූපී බ්‍රහ්මයන්ට එසේ සූක්ෂ්ම ශරීරයක් තියෙනවා ද?**

පිළිතුර: කාම භූමියේදී අරූප සමාපත්ති වඩන කෙනෙක් රූපයෙ ආදීනවය සලකනවා. රූපයෙන් නොයෙක් විපත්ති වෙනවා කියලා හිතල අරූප ධ්‍යාන හතරෙන් තමා කැමති ධ්‍යානයක් වඩනවා. ඒ ධ්‍යාන හොඳට පුරුදු පුහුණු කළ නිසා නොපිරිහුණු ධ්‍යානයෙන් යුතුව මරණයට පත්වී අරූපාවචර බඹලොව ඉපදෙනවා. රූපය ඉක්මවූ ධ්‍යාන වැඩූ නිසා එහි රූපයක් නැතිව නාමකය පමණක් පවතිනවා. ඒකට එහා මෙහා ගමන් කරන්නවත් බැහැ. එතන චිත්ත චෛතසික් ධර්ම පවතිනවා. සතර නාමස්කන්ධ තියෙනවා. ධ්‍යාන සිතේ පවති අරමුණ අනුවයි එහි පැවැත්ම සිදුවෙන්නේ. පර්වතයක් උඩට ගොඩවුනු කෙනා පර්වතය

අල්ලාගෙන ඉන්නවා වගේ ඉණිමගට ගොඩවුනු කෙනා ඉණිමග අල්ලගෙන ඉන්නවා. ඒ වගේ තමන් ලබාගත්ත ධ්‍යාන අරමුණ තමයි ඒ ඇත්තන්ගේ සිතේ පවතින්නේ. සියුම් කයක් වත් එහි නැහැ. සියුම් කයක් හෝ එතැන පවතිනවා නම් අරූප කියන්න බැහැ. රූප ඉක්මවා යෑමේ ධ්‍යාන වැඩූ නිසා නාමස්කන්ධය පමණක් එහි ආයු පවතින තුරු තියෙනවා. ඔවුන්ට බණ අසන්න බැහැ. දිවැස් නුවණ නැහැ. පෙරවිසූ ආත්ම දක්නා නුවණ, සෘද්ධිවිධඥාණ මේ කිසිවක් නැහැ. රූපාවචර සිතක් වත් පහළ වෙන්නේ නැහැ. රූපාවචර සිත් පහළ වෙන්නේ හෘද වස්තුව ආශ්‍රය කරගෙනනෙ. හෘද වස්තුව නැති නිසා ඒ සිත් පහළ වෙන්නේ නැහැ.

සෝවාන් නොවී එහි ගියා නම් එහිදී සෝවාන් වන්නට බැහැ. සෝවාන් වී එහි ගියානම් එහිදි ඉතිරි මාර්ගඵල ලබනවා. ආයේ ආපසු එන්නේ නැහැ. එහිදි නාම ධර්ම විදර්ශනාව පාදක කරගෙනයි ඔහුට මාර්ග ඵල නුවණ උපදවන්න පුළුවන් වෙන්නෙ. රූප ධර්ම විදර්ශනාවක් එතන නැහැ. එතන පටිසන්ධිය නාම පටිසන්ධියයි. චුතියත් නාම චුතියයි. එතැන රූප කායක් නික්ෂේප කරන්නේ නැහැ.

අරූප භවයකින් චුතිය වෙන කොට යට අරූප තලයක උපදින්නේත් නැහැ. තමාට වඩා ඉහළ අරූප තලයෙ උනත් ඉපදෙන්න පුළුවන්. මනුස්ස ලෝකේ ඉපදෙනවා නම් ත්‍රිහේතුකව ඉපදෙනවා.

**ප්‍රශ්නය: රූපයක් නැතිනම් ඒ භවය “සත්ව” වශයෙන් සැලකීමට හැකිද?**

**පිළිතුර:** පුළුවන්. ඒ උපන් පුද්ගලයා නාමස්කන්ධයට ඇලුම් කරනවා. ලෝභය තියෙනවා. එනිසා සම්මුති වශයෙන් එතැන සත්ත්වයෙක් හැටියට හඳුන්වන්න පුළුවන්.

**ප්‍රශ්නය: එම අරූපාවචර සත්ත්වයන් සහ අසඤ්ඤතලයේ සත්ත්වයන් අතර වෙනස පහදා දුන්නහොත්?**

පිළිතුර: අසඤ්ඤතලයේ සත්ත්වයන්ට සිතක් ඇත්තේම නැහැ. රූපකාය පමණයි තියෙන්නෙ. දැනීමක් වේදනාවක් කිසිවක් නැහැ. ඒ ඇත්තන්ට ඒ ජීවිතේ දී මාර්ගඵල කිසිවක් ලැබෙන්නේ නෑ සිතක් නැති නිසා. කල්ප 500 ක් එහෙ ඉඳලා එයින් චුතවෙනවා විතරයි අරූපාවචර බඹතලයේ රූපයෙන් තොරව නාමස්කන්ධය පමණක් පවතිනවා. ධ්‍යාන සිතේ අරමුණු අනුවයි ඒ සිත පවතින්නේ. සියුම්ව පවතින කයක්වත් අරූපාවචර බ්‍රහ්මයින්ට නැහැ. රූපකාය නැති නිසාමයි එතෙන්ට අරූප භූමිය කියා හඳුන්වන්නේ.

**ප්‍රශ්නය: ගරු කටයුතු ස්වාමින් වහන්ස, ආනිශංස ඵලය සහ නිස්සන්ද ඵලය කියා දෙයක් අපි අහලා තිබෙනවා. මේ පිළිබඳවත් පැහැදිළි කරන ලෙස ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.**

පිළිතුර: කර්මයේ විපාක දෙන ආකාරය අනුව තියනවා ආනිශංස ඵලය නිස්සන්ද ඵලය කියලා මේ පින්වතුන් අහල තියෙනවා නේද? අපේ සිද්ධාර්ථ ගෞතම බෝසතාණන් වහන්සේ මව් කුසින් බිහිවූ අවස්ථාවේ දස දහසක් ලෝක ධාතුව තුළ ප්‍රාතිහාර්යය සිද්ධ වුනා කියලා. අපායේ ගිනි නිවුනා. ප්‍රේත අපායේ සා පිපාසාදි දුක් නැතිවුනා. තිරිසන් අපායේ බිය තැතිගැනීම් නැතිවුනා. මනුලොව උපතින් අන්ධයන්ට ඇස් ලැබුණා. බිහිරි අයට කන් ඇසුනා. ගොළුවන්ට කථා කරන්න පුළුවන් වුනා. බෝසතාණන් වහන්සේගේ බිහිවීමේ ආනිශංස ඵලයයි. ඒ අතර දස දහසක් ලෝක ධාතුව තුළ සිදුවූ ප්‍රාතිහාර්යය නිස්සන්ද ඵලයයි. නිස්සන්ද කියන්නේ තමාගේ පුණ්‍යභාග්‍ය නිසා ලෝකයට ඒ ආනිශංස බෙදී යාමයි. අන්ධයන්ට ඇස් ලැබුණේ බිහිරි අයට කන් ඇසුණේ බෝසතාණන් වහන්සේගේ කුසල කර්මයේ නිස්සන්ද ඵලය නිසා.

ඒ වගේම ජෝතිය කුමාරයා ඉපදුන දවසෙ මුළු මහත් රජගහනුවරම බැබළුණා කියලා අහල ඇතිනේ. ඒ ආලෝකය ඇති වුනේ නිස්සන්ද

ඵලය නිසා. මේ ලංකාවේ දුටුගැමුණු රජතුමාගේ පුතෙක් හිටයා සාලිය කුමාරය කියලා. මේ කුමාරයා ඉපදුන දවසේ ඇල් වී වර්ෂාවක් වැස්සා කියලා සඳහන් වෙනවා. ඒ නිස්සන්ද ඵලයයි. එසේ වුනේ ඒ කුමාරයාගේ පුණ්‍ය බලය නිසා. තමාගේ කුසල විපාකය තමන්ටමයි. ලොවට බෙදී යන ආනිශංසය නිස්සන්ද ඵලයයි.

වෙස්සන්තර රජ්ජුරුවො වංකගිරියෙ සිට ආපසු රජවාසලට ආවා පියමහ රජතුමාගේ ආරාධනය නිසා ඇවිල්ලා හිතුව දැන් මගෙන් දන් ඉල්ලගෙන එක එක්කෙනා එයි මම ඔවුන්ට මොනවද දෙන්නෙ කියලා. එතනදි උන්වහන්සේගේ පුණ්‍ය බල මහිමය නිසා මුළු මහත් නගරය පුරා රන් කහවනු වැහි වැස්සා. දණක් පමණ කහවනු වැස්සක් වැස්සා. අන්න රටටම ආනිශංස ඵලය බෙදිලා යන හැටි. තමා කළ කුසලයේ කර්ම ඵලය තමාටයි. තමා නිසා ලොවට සැලසෙන ශාන්තිය නිස්සන්ද ඵලයයි. අකුසල පැත්තෙනුත් ඔහොම තමයි.

බුදුරජාණන් වහන්සේ ජීවමාන කාලේ හිටිය ආනන්ද කියල සිටුවරයෙක්. ඔහු කවදාවත් යහපත් කුසල ක්‍රියාවක යෙදුනේ නෑ. දෙන දන් පවා වැලැක්වුවා. තම පුතා වූ මූලසිරි කැඳවා අව්වාද කළා කවදාවත් දන් දෙන්න නම් එපා. දන් දුන්නොත් වස්තු හානි වෙනවා කියලා. මේ මනුස්සයා මැරිලා ඈත පළාතක සැඩොල් ගමක මව්කුසක පිළිසිඳගත්තා. මේ තැනැත්තා මව්කුසේ උපන්නම ඒ සැඩොල් ගමේ ගෙවල් දාහටම දුර්භික්ෂය ඇති වුනා. ගොවිතැන් හත්වාරයක් පාළු වුනා. රජතුමාගෙන් දඬුවම් සත්වාරයක් ලැබුණා. පස්සේ කාලකණ්ණි සලාක ඇද්දා. සලාක ඇදීමේදී මේ දරු ගැබ සහිත මේ අම්මා තේරුණා. පසුව ඇය ගමෙන් පන්නලා දැම්මා. මේ අම්මා විශාල වෙහෙසක් දරා සිගමනේ ගිහින් මේ දරුවා බිහිකළා. දරුවා වඩාගෙන ගියොත් කැඳ ටිකක්වත් ලැබෙන්නේ නැහැ. දරුවා ගහක මුලක හෝ තියල ගියදාට කුසපුරා ආහාර ලැබෙනවා. ඒ තරමටම තමා කළ පාප කර්ම නිසා මුළු ප්‍රදේශයටම අභාග්‍ය සම්පන්න කාලයක් උදාවුනා. අන්න ඒ වගේ අකුසල පැත්තක්

තියෙනවා නිස්සන්ද ඵල විපාක. පින්මද රජ කෙනෙක් රජ වුනා නම් ඒ රජුගේ අකුසලය නිසා රටවැසියන්ටත් අන්තරාවක් ඇතිවෙනවා. රෝගභය සතුරු උපද්‍රව ඇති වෙනවා. මෙන්න මේ නිසා කුසල් වූද අකුසල් වූද කර්මයන්ගේ තමා පමණක් විඳින විපාකය ආනිශංස ඵලයයි. ලොවට බෙදීයන විපාකය නිස්සන්ද ඵලයයි කියා අපි තේරුම් ගන්නට ඕනෑ.

**ප්‍රශ්නයː අප කියවූ ත්‍රිපිටකයට අයත් ථෙරගාථා, ථෙරිගාථා ග්‍රන්ථ වල බොහෝ තැන්වල ඉතා ස්වල්ප වූ කුසලය නිසා පවා කල්ප ගණන් සැප විපාක ලැබූ අයුරු කියවෙනවා. සමහර විට මල් කිහිපයක් පුදා අනේකවාර සුගතිසැප සාදාගත් අයුරු පැහැදිළි වෙනවා. තවද, අකුසල් පැත්තෙනු කුඩා වූ ද අකුසලය නිසා ආත්ම පන්සිය ගණන් දුක් විපාක ලැබූ හැටි බණ කථාවල අප අසා තිබෙනවා. ඒ පිළිබඳ අප ස්වාමීන් වහන්සේගෙන් විමසූ පසු ලද පිළිතුරු මෙසේය.**

පිළිතුරː පින්වතුන් අහලා ඇති

**එක පුප්ඵං චජිත්වාන‍ං - අසීතිං කප්ප කොටියො**

**දුග්ගතිං නාභං ජානාමී - වුප්ප දානස්සිදං ඵලං**

ඒක පුප්පිය අපදාන දේශනාවේ සඳහන් වෙනවා එක මලක් පූජා කළ පිනෙන් දිව්‍ය ලෝකයෙහි අසූකෝටි වාරයක් උපන්නා කියලා. ඊළඟට මනුලොව ඉපදිලා රහත් වුනා. එක මලක් පූජා කරලා කොහොමද මේක සිද්ධ වුනේ කියලා අපි බලන්න ඕනෑ. පෙර ජාතියෙක චෛත්‍ය රාජයාණන් වහන්සේ වඳින්න යන සැදැහැවතෙක් බුදුගුණම කියව කියව යනවා. යනවිට මගදි දකින්න ලැබුණා විලක පිපී තිබුණ දිය බෙරලිය මලක්. දැක්ක ගමන්ම දොහොත් නගාගෙන බුදුගුණ කීවා ඊළඟට විලෙන් දැත සෝදා පිරිසිදු කරගත්තා බුදු ගුණ කියමින් මල නෙළා ගත්තා. එය දෝතින් ගෙන හිස මුදුනේ තියාගෙන බුදුගුණ කියව කියවා චෛත්‍ය වෙත ගියා. චෛත්‍ය වෙත පැමිණ බුදුගුණ කියමින් මල් ආසනය මත තැන්පත් කළා. අනතුරුව මල් පූජා කරලා

චෛත්‍ය ප්‍රදක්ෂිණා කරලා බුදුගුණ අරමුණෙන්ම සිය නිවසට පැමිණියා. දැන් බලන්න පෙර ගමන් පසු ගමන් වශයෙන් එතන වැඩුනේ බුද්ධානුස්සතියයි. එවිට එක අසරු සැණක් ගහන කෙටි කාලයක් අපේ සිතේ චිත්තවාර කෝටි ලක්ෂයක් පහළ වෙනවා. චිත්තවාර කෝටි ලක්ෂවාරයක ජවන්වාර කොච්චර පහළ වෙනවද? මේ සෑම කුසල ජවන් වීථියකම පළමු ජවන් සිත හැර අනෙක් ජවන් සිත් හයෙන් පටිසන්ධිවාර හයක් ලබාදෙනවා. එක ජවන් සිතක පටිසන්ධිවාර ලබාදෙන්නේ එකවරයි. ප්‍රවෘත්ති විපාක අසංඛෙය්‍ය වාරයක් ලබාදෙන්න පුළුවන්. යම්තැනක වෙනත් කුසලයකින් උපන්නම ප්‍රවෘත්ති විපාක වශයෙන් අනේකවාර විපාක දෙන්න පුළුවන්. මේ කුසල පැත්තෙන්. අකුසල පැත්තෙනුත් එහෙමයි. පාපයක් කරල ආත්ම සිය ගණන් දුක් විපාක ලබන්නේ ප්‍රවෘත්ති විපාක හැටියට.

ලෝසක කියලා ස්වාමීන් වහන්සේ නමක් හිටිය අහල ඇති. අපේ බුද්ධශාසනයෙ රහතුන් වහන්සේ නමක්. උන්වහන්සේ පෙර කාශ්‍යප බුද්ධශාසනයේ විහාරාධිපති ස්වාමීන් වහන්සේ කෙනෙක්. ඔතෙන්ට වැඩිය රහතුන් වහන්සේ නමක්. එම රහතුන් වහන්සේ බොහොම ප්‍රසාදනීය උත්තමයෙක්. ගමේ දායක මහතා දුටුහැටියේම ආරාධනා කළා පසුදින දානෙට. පන්සලේ විහාරාධිපති හිමියන්ට ආරාධනා කළේ දෙවනුව. ඒකෙන් විහාරාධිපති හිමියන්ට කේන්ති ගියා. මට දෙවනුව ආරාධනා කළා මේ ආගන්තුක හාමුදුරුවන්ට ඉස්සරවෙලා ආරාධනා කළා කියලා. දැන් මේ දානෙට ආගන්තුක හාමුදුරුවා වැඩියොත් මා දෙවැන්නා වෙනවා කියලා හිතේ තරහ තියාගෙන සිටියා. පසු දින මේ රහතුන් වහන්සේට නොදැනෙන්න නිය පිටින් ගෙඩියට තට්ටු කර තමා තනියම දානෙ ගෙදරට වැඩියා. දානෙ ගෙදර ගියාම දායක මහත්තයා ඇහුවා කෝ ආගන්තුක ස්වාමීන් වහන්සේ කියලා. මම ගෙඩියත් ගැහුවා ඒත් ඇහැරුණේ නෑ. තාම නිදි කම්මැලි හාමුදුරුනමක් කියලා පිළිතුරු දුන්නා. එහෙම නම් ස්වාමීන් වහන්සේ වළඳන්න මම

ඒ ස්වාමීන් වහන්සේට දානෙ ටිකක් ගෙනියන්න දෙන්නම්. ගමන් විඩාව නිසා වෙන්නැති අපහසුව වයොවෘද්ධයිනේ ඒ ස්වාමීන් වහන්සේ කියලා දායක මහත්මයා කීවා.

පසුව අර ස්වාමීන් වහන්සේ වළඳලා ඉවර වුනාම පාත්‍රය අරගෙන පිරිසිදු කරලා දානේ එකක් නැවත පාත්‍රයට බෙදලා ආගන්තුක ස්වාමීන් වහන්සේට පිටත් කළා. මේ හාමුදුරුවො මගට ගිහිල්ලා පාත්‍රය බැලුවා. බොහොම ප්‍රණීත ආහාරයක් මේක අනුභව කළොත් නම් මේ ආගන්තුක හාමුදුරුවො මෙතනින් පන්නගන්න බැරිවෙයි කියලා හිතලා දානෙ ටික ගිනි ගොඩකට හැලුවා. විහාරෙට ගිහින් දොර ඇරලා බැලුවම කවුරුත් නැහැ රහතන් වහන්සේ කල් ඇතිවම වැඩල. ඔය පාපය උන්වහන්සේගේ සිතේ බලපෑවා. මරණාසන්න අවස්ථාවෙත් සිහිවෙලා අපායේ උපන්නා. අවුරුදු කෝටි ප්‍රකෝටි ගාණක් අපායෙ දුක්වින්දා. අන්තිමේ දී ආත්ම පන්සීයක් තිරිසන් ලෝකේ උපන්නා. මනුලොව ආත්ම පන්සීයක අන්ත දුගී දුප්පත්ව ඉපදුනා. අන්තිම ආත්මේ ලෝසක නමින් අන්ත දුගියෙක් වෙලයි ඉපදුනේ. මේ දරුවා ඉවත දමන ඉඳුල් වතුරේ බත් ඇට අහුලන් කමින් ජීවත් වුනේ. එක් දිනක් සැරියුත් මහ රහතන් වහන්සේට හමුවුනා. උන්වහන්සේගෙ නුවණට පෙනුන මේ දරුව සසර පාරමී පිරූ කෙනෙක් කියලා. ළංවෙලා විමසුවා 'දරුව, ඔබ මහණ වෙන්න කැමති ද?' කියා. 'අනේ ස්වාමීන් වහන්ස මම නම් කැමතියි මහණ වෙන්න. ඒත් මම වගේ අය කවුද මහණ කරන්නේ ' කියා මේ ළමයා පිළිතුරු දුන්නා. සැරියුත් මහ රහතන් වහන්සේ මේ දරුවා විහාරයට එක්කරගෙන ගිහින් නාවා පිරිසිදු කොට පැවිදි කළා.

ඒ නම එක්කගෙන ගියොත් සැරියුත් මහරහතන් වහන්සේටත් දානෙ වරදිනවා. ඒ නිසා කුටියෙ තියලයි පිණ්ඩපාතේ වඩින්නේ. සැරියුත් මහරහතන් වහන්සේ දානෙ වළඳලා මේ නවක කුඩා හිමියන්ට කවුරුන් අත හෝ දානෙ ටිකක් එවනවා. නමුත් කවදාවත් දානෙ ලැබෙන්නේ නැහැ. මගදි කාට හෝ දෙනවා. නැත්නම් අර කුඩා හිමියො නොපෙනී

යනවා. දවස් හතේ අසදෘශ දානෙ බෙදන්න ආවම පාත්‍රය පිරිල වගේ පේනවා. එතරම්ම අකුසල විපාක වාරයක්. අවසානෙදි රහත් වුනා. රහත් වුනත් කුස පිරෙන්න ආහාර ලැබුනෙ නැහැ. අන්තිමට පිරිනිවන් පාන දවසෙ වෙනද වගේම සැරියුත් හාමුදුරුවන් දානේ ටිකක් එව්වා. ඒක ලැබුණේ නැහැ. සැරියුත් ස්වාමීන් වහන්සේ වළදා ආපසු පැමිණ විමසුවා දානේ ලැබුණා ද කියලා. එවිට බිම බලාගත්තා. උන් වහන්සේ මොනතරම් කාරුණිකද ආයෙ පිණ්ඩපාතේ වැඩල චතුමධුර පාත්‍රයක් පිණ්ඩපාතේ කරගෙන ඇවිල්ලා තමන් වහන්සේගේ අතේ තියාගෙන වළඳන්න කීවා. ඔන්න අන්තිම දවසෙ වළඳපු දානේ. එදා තමයි කුස පුරා දානයක් වැළඳුවේ. මොකද මේ කාරණය තමා කළ පාපයේ ප්‍රවෘත්ති විපාක වාර ආපු හැටි. පූර්ව ජාතියේ කළ අකුසල් කර්මයෙන් ආත්ම 1500 ක් දුක් වින්දා. එනිසා එක කර්මයක් කරන කොට අප්‍රමාණ ජවන් සිත් පහළ වෙනවා. එබැවින් අපි කුසලය හෝ අකුසලය කුඩයි කියලා හිතන්න වටින්නේ නැහැ. ඒක කර්මයක් කරන කොට කෝටි ප්‍රකෝටි ගණන් කර්ම ඒකට එකතු වෙනවා. ඒ නිසා අපි සියලු දෙනාම සිත් පුරුදු කරන්න ඕනෑ මෙහෙම.

**සැප දුක් වේදනා ගෙන දෙමින් සෙවනැල්ලක් සේ තමා සමඟම ගමන් කරන එකම දෙය නම් කුසලාකුසල කර්මයි. එබැවින් මා තුළ හටගන්නා වූ කුඩා වූ ද, අකුසල චේතනාවන් දුරලමින් කුසල චේතනාවන් ම උපදවා ගැනීම පිණිස සැම විටම උත්සාහවන්ත වන්නෙමි. ඒ මාගේ උත්සාහය සියලු භවගාමී දුක් දුරුකොට රහත් මග උපදවා ගැනීම සඳහාය. ඒ පිණිස මම සැදැහැයෙන් සීල සම්පන්නව භාවනානුයෝගියෙක් වන්නෙමි යි. අධිෂ්ඨාන කරගන්න.**